# වින්දිතයන්ගේ නඩු ප්‍රමාදවීම හේතුවෙන්
# අයිතීන් කඩවීම.

ඉනෝමා කරුණාතිලක

ප්‍රකාශනය
මහනුවර පදවි ජනසංනිවේදන කේන්ද්‍රය
ආසියානු මානව හිමිකම් කොමිසම

පටුන

පිටුඅංක


- ස්තුතිය 01
- **පෙරවදන** **02**
- පළමු පරිච්ඡේදය
    - i. හැඳින්වීම 03
    - ii. අරමුණු 03
    - iii. පර්යේෂණ ගැටළුව :- (Research Problem) 03
    - iv. උපකල්පන :- (Hypotheses) 04
    - v. පරමාර්ථ :- objectives 04
- දෙවැනි පරිච්ඡේදය
    - i. මූලික න්‍යායාත්මක පදනම 05
    - ii. අධිකරණය ක්‍රියාවලිය පිළිබඳ නීතිමය පසුබිම. 06
- තුන්වන පරිච්ඡේදය
    - i. පවත්නා අධිකරණයේ නඩු ප්‍රමාද වීම සඳහා හේතු වී ඇති කරුණු 08
    - ii. අධිකරණයෙන් නඩු ප්‍රමාදණයන් පැවතීම නිසාවෙන් මිනිසුන්ගේ අයිතීන් කඩවීම් 08
- හතරවන පරිච්ඡේදය
    - i. ක්‍රමවේදය 10
    - ii. දත්ත හා තොරතුරු ඉදිරිපත් කිරීම 10
- පස්වන පරිච්ඡේදය
    - දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම 26
- හයවන පරිච්ඡේදය
    - නිගමනය 31
    - විකල්ප යෝජනා 31
    - පරිශීලනය කළ ග්‍රන්ථ 32
    - බාධක 32

## ස්තුතිය:-

මානව හිමිකම් ඩිප්ලෝමා පාඨමාලාවට අවශ්‍ය ව්‍යාපෘති වාර්තාව පිළියෙල කිරිම සඳහා අවශ්‍ය මූලික තොරතුරු ලබාදුන් නීතිඥ සංජීව වීරවික්‍රම මහතාට පළමුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි. තවද නිරතුරු මගපෙන්විම ලබාදුන් දොස්තර ඉදුවර ගුණරත්න මහතාටද, අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට සහය දුන් ආසියානු මානව හිමිකම් කොමිසමට අනුබද්ධිත ආයතනවල අධ්‍යක්ෂතුමන්ලාටද ආසියනු මානව හිමිකම් කොමිසමේ පිලිප් සේතුංග මහතාටද මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි. තම ජංගම පරිඝනකය ලබා දෙමින් මා හට සහය දුන් නයනා සමරවීර මෙනවියටද, පරිඝනක කටයුතු කරදීමෙන් මට සහය දුන් රම්ලානි සිල්වා, ලුසිල් අබේරත්න, ශිරෝමි ලෝචි, අමිලා සේරසිංහ, එරංගිකා මානවඩුගේ මෙනවියන්ටද මාගේ ස්තුතිය පුදකරමි. තවද අවශ්‍ය ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කර දුන් සියලුම නිතීඥ මහතවරුන්ටද මුල සිට මනා සහයෝගයක් ලබා දුන් ශ්‍රියන්ත බණ්ඩාර මහතාටද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මානව හිමිකම් අංශයේ සියලු දෙනාටමද, අවශ්‍ය මගපෙන්වීම ලබා දෙමින් නිරන්තරයෙන් මා දිරිමත් කල මාගේ සහෝදර මනෝජ කුමාර් මහතාටද මාගේ හෘදයාංගම ස්තුතිය මෙයින් පුදකරමි.

ඉනෝමා කරුණාතිලක

## පෙරවදන

බොහෝ ආසියාතික රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේද අහිංසක මිනිසුන් නඩු ප්‍රමාදය හේතුවෙන් විවිධ ගැටළු වලට මුහුණ දෙති. මෙය මූලික මානව අයිතිවාසිකම් කඩවීමක් වන අතර ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන ප්‍රඥප්තියේ 14 (3) (C) වගන්තිය මූලික වශයෙන් කඩවීමකට ලක් වීඇත. ශ්‍රී ලංකා රජයද ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන ප්‍රඥප්තියට අත්සන් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමටද බැඳී සිටී.

රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමත්, එමෙන්ම රටේ මානව හිමිකම් ආරක්ෂා කිරීමත් රජයේ මූලික වගකීම වේ. නමුත් සමාජය දෙස බලන විට පෙනීයන්නේ සාමාන්‍ය ජනතාව මානව හිමිකම් උල්ලංඝනය වීම නිසා ඇතිවන ඵලවිපාක වලට ගොදුරු වී සිටින බවයි. පොලිසියේ වධහිංසා, වෛද්‍යවරුන්ගේ නොසැලකිලිමත් ප්‍රතිකාර, රජයේ දේශපාලන ආයතන වල අඩුපාඩුකම්. ව්‍යවස්ථා නොසලකා හැරීම් ආදී රජයන් විසින් ඇතිකල හැකි තවත් නොයෙක් ගැටළු ඇත. අවසානයේ මේ සියල්ලේ ඵලවිපාක විඳින්නේ සාමාන්‍ය ජනතාවයි. එහෙත්, ඵලවිපාක දැනගැනීමෙන් පමණක් දේවල් වෙනස් කිරීමට නොහැකි අතර ඒ ඵලවිපාක ගෙන දෙන ආයතනික ප්‍රශ්ණ හා නීතිමය ප්‍රශ්ණ පිළිබඳ අවබෝධයක් ජනතාව ඇති කර ගත යුතු බව බොහෝ විද්වතුන්ගේද මතය වන්නේය.

විශේෂයෙන් පොලිසියේ ක්‍රියාකලාපය හේතුවෙන් සාමාන්‍ය ජනතාව පීඩනයට ලක් වේ. මන්ද නිරන්තර පොලිස් වධහිංසාවට ලක්වනුයේ මුදල් තිබෙන හෝ බලවත් ධනවත් පුද්ගලයන් නොව අහිංසක සාමාන්‍ය දුප්පත් ජනතාව වීමයි. පසුගිය වසර කිහිපය තුල ළමුන් වධහිංසාවට ලක් වූ ප්‍රමාණය අතිවිශාලය. ළමුන්ගේ මනස තේරුම් ගැනීමට නොහැකි පොලිස් නිළධාරීන් හේතුවෙන් ළමුන් පමණක් නොව ඔවුන්ගේ ඥාතීන් දෙමාපිය සහෝදර සහෝදරියන්ද පීඩනයට ලක්වී සිටිති.

තවත් පැත්තකින් ළමා දූෂණය හේතුවෙන් අහිංසිකාවන් පීඩනයට ලක්වී ඇත. සාරධර්ම පිරිහුනු සමාජයක් තුල පියා තම දූ වරුන් නොහඳුනන සහෝදරයා තම සහෝදරිය නොහඳුනන තත්වයකට මිනිසා පත් ව අහිංසක දැරියන් කාමාතුරයින්ගේ ගොදුරට ලක් වී ජීවිත අකාලයේ මියැදී හෝ විනාශ වී ඇත .

රටක නීතිය සුරකින අයිතීන් සුරකින වගකීම පැවරී ඇති රජයට නීතිය නිසියාකාරව ක්‍රියාත්මක කරවීමට පුළුවන් කමක් ලැබී නැත. නීති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා හේතුවෙන් අහිංසක වින්දිතයන් නිරන්තර වධ හිංසනයට හා පීඩනයට ලක්ව ඇත. නඩු ඇසීමේ ප්‍රමාදය හේතුවෙන් තමාට වූ අසාධාරණයට සාධාරණත්වය ඉෂ්ඨ කර ගැනීමට නොහැකිව අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ කලකිරී තම නඩු ඉල්ලා අස්කර ගැනීමට පවා අද වින්දිතයින් පෙළඹී ඇත. මෙම හේතුවෙන් අධිකරණ ක්‍රියාවලියේ ප්‍රමාදය අපරාධකරුවනට මනා රුකුලක් වී ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ව්‍යාපෘති වාර්ථාව සඳහා ඉහත සඳහන් සියලු කාරණා සැලකිල්ලට ගෙන නඩු ප්‍රමාද වීමට හේතු වූ කරුණු සොයා බලා මේ හේතුවෙන් සිදු වන වින්දිතයින්ගේ අයිතීන් කඩවීම පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමද අත්‍යවශ්‍ය නඩු තීන්දු දීම ප්‍රමාද වීම වැළැක්වීමට අවශ්‍ය විකල්ප යෝජනාද මෙමගින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

පළමු පරිච්ජේදය

**හැඳින්වීම**

රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගැනීමත්, එමෙන්ම රටේ මානව හිමිකම් ආරක්ෂා කරගැනීමත් සම්බන්ධයෙන් ලංකාව අද තීරණාත්ම මොහොතකට පැමිණ සිටියි. මෙම කරුණ දෙකේදීම ඉතා වැදගත් වන්නේ, ජනතාව මානව හිමිකම් කඩයිම් වලට හේතු වන කරුණු පිලිබඳව අවබෝධයක් ඇතිකර ගැනීමයි. විශේෂයෙන් රටේ පවතින නීතී නිසියාකාරව සිදු නොවීම හේතුවෙන් ජනතාව තුල ඇත්තේ නීතිය පිළිබඳ පූර්ණකලකිරීමකි.

'ශ්‍රී ලංකාවේ නඩු විසදීමේදි ඇති පමාව බොහෝ ගැටළු වලට තුඩු දී ඇති බව විනිශ්චයකාරවරු, නීතිපතිතුමා හා අපරාධ පරයේක්ෂණයේ යෙදෙන පොලිස් නිලධාරීන් නිතර නිතර ප්‍රකාශ කරයි. ලංකාවේ අපරාධ නඩු වලින් 4 % ප්‍රමාණයක් පමණක් සාර්ථකව අවසාන කිරිමට හැකි වන බව වාර්ථා පෙන්වා දෙයි. ඊට මූලික හේතුව වන්නේ, නඩු පමාව නිසා සාක්ෂිකරුවන්ගේ දිරි බිඳී, නඩු අතහැර දැමීම ආදියයි. ( උ. ගැ. ලංකාවේ මානව හිමිකම් හා ඒවාට විසදුම් - බැසිල් ප්‍රනාන්දු මහතා) මේ හේතුව නිසා විශේෂයෙන් වින්දිතයන් ගේ මූලික අයිතිවාසිකම් කඩ වන අතර, නීති ක්‍රියාත්මක නොවීම හෝ දඩුවම් නොලැබීම හේතුවෙන් අපරාධ කිරිමට අපරාධකරුවන් නොබියව ඉදිරිපත්වේ. විශේෂයෙන් පොලිස් වදහිංසාවට හා දූෂණයට ලක් වු වින්දිතයන්ගේ (විශේෂයෙන් ළමා වින්දිතයන්ගේ) අයිතීන් මූලික වශයෙනම් උල්ලංඝනයවේ.

**අරමුණු :-**

මෙම පරයේෂණ වාර්ථාව මගින්, නඩු ප්‍රමාද වීමට හේතු සොයා බලා, එම හේතුවෙන් වින්දිතයන් මුණපාන ප්‍රධාන ගැටළු පිළිබඳව විස්ථරාත්මක වාර්ථාවක් ඉදිරිපත් කිරිමට බලාපොරොත්තුවේ. තවද මේ සඳහා යෝජනා ඉදිරිපත් කිරිමට පුළුල් පරිකෂණයක් කිරිමටද බලාපොරොත්තුවේ.

**<u>පරයේෂණ ගැටළුව :- (Resarch Problem)</u>**

'ලංංකාවේ නඩු විසදීම පමාවීම, වින්දිතයන්ගේ අයිතීන් කඩ වීමට බලපාන්නේ කෙසේද ?'

**උපකල්පන :- (Hypotheses)**

නඩු ඇසීමේ ක්‍රියාවලිය කඩිනම් වීම වින්දිතයන්ට නිදහස්ව තම පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමෙන් ගරුත්වයෙන් යුතුව ජීවත් වීමට මග සැලසේ.

**<u>පරමාර්ථ :- objectives</u>**

(1) ලංකාවේ නඩු ඇසීම ප්‍රමාදවීමට හේතු වන කරුණු සොයා බැලීම.

(2) මෙම හේතුවෙන් වින්දිතයන් ඔවුන්ගේ පවුල් සාමාජිකයින් මුහුණපාන ප්‍රධාන කරුණු පිළිබඳව සොයා බැලීම.

(3) නඩු ප්‍රමාද වීම හා අයිතිවාසිකම් කඩවීම අතර සබඳතාව සොයා බැලිම.

(4) නඩු ඇසීම ඉක්මන් කිරීම සඳහා විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම.

**<u>ඉලක්ක කණ්ඩායම :- (Target group)</u>**

ප්‍රධාන වශයෙන් නඩු ප්‍රමාද වීම හේතුවෙන් ගැටළු වලට මුහුණ දී සිටින ළමා වින්දිතයන් (වධහිංසාවට හා දූෂණයට ලක් වූ) හා ඔවුන්ගේ දෙමව්පිය සහෝදර සහෝදරියන්.

සැ.යු :- ලංකාවේ සියලු අපරාධ වලට ලක් වූ වින්දිතයින් හවුල් කර ගත නොහැකි නිසා ළමා වින්දිතයින් තෝරා ගන්නා ලදි.

දෙවැනි පරිච්ඡේදය

## <u>මූලික න්‍යායාත්මක පදනම</u>

ලෝකයේ පවත්නා නිදහස යුක්තිය හා සාමය යන්නෙනහි පදනම මිනිස් පවුලේ සියළුදෙනාගේම සහජ ගරුත්වය හා අන්සතු කළ නොහැකිවූ සහ අයිතිවාසිකම් පිළිගැනීම වන හෙයින්ද මානව අයිතිවාසිකම් නොතැකීමේ අවඥාවට ලක් කිරීමේ ප්‍රථිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හෘද සාක්ෂිය සාහසක පීඩනයට භාජනය කෙරෙන ම්ලේච්ඡ කුරකම් සිදුවී ඇති හෙයින්ද. මිනිස් වර්ගයාට අදහස් ප්‍රකාශ කිරීමේ හා විශ්වාස ඇදහිලි දැරීමේ නිදහස බියෙන් හා අගහිඟකම් තොරවීමේ නිදහසක් බුක්තිවිදීමට හැකි ප්‍රජාවක් ඇරඹීම පොදු ජනතාවගේ ශ්‍රේෂ්ඨම අපේක්ෂාව ලෙස  ප්‍රකාශයට පත්වී ඇත. මේ නිසා මානව අයිතිවාසිකම් හා මූලික ස්වාධීනත්වයන් කෙරෙහි විශ්ව ගරුත්වයෙන් ඒවා රැකදීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් විවිධ ප්‍රඥප්ති හෙලි දක්වා ඇත. සමස්ථයක් ලෙස ශ්‍රී ලංකා රජය සියළුම ප්‍රකාශන වලට හා ප්‍රඥප්ති වලට අත්සන් තබා ඇති අතර රජයක් ලෙස ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

රටක අධිකරණය රාජ්‍යයේ සියළුදෙනාගේ අයිතීන් සුරැකීමට බැඳී සිටින අතර ශ්‍රී ලංකා අධිකරණ ක්‍රියාවලිය දෙස බැලීමේදී නඩු ඇසීම පිලිබඳ ඉතා දීර්ඝ කාලයක් ගතවන බවත් එය යුක්තිය පසිඳලීමට විශාල බාධාවක් බවත් මනාව පෙනීයන කරුණකි. ලෝක බැංකුව පවා මේ පිළබඳ නිර්දේශ ලංකාවේ ආණ්ඩුවට ඉදිරිපත්කර ඇති අතර රජයේ හා අධිකරණයේ සියළුම ප්‍රධානීන් මේ පිළිබඳ තමුන්ගේ අවධානය යොමුකර ඇති බව නිතර නිතර ප්‍රකාශ කරයි. නඩු පමාවීමෙන් වැඩි පාඩුව විඳින්නේ සමාන්‍යය ජනතාව වන අතර ඉන් වාසි හා ප්‍රයෝජන ලබන්නේ ධනයෙන් හා සමාජ තත්වයෙන් බලගතු උදවියයි.

[1]සාර්ථකව නඩු ඇසීමට බැරිවීම සමාජයට ඉතාමත් අහිතකර ප්‍රථිඵල ඇති කරයි. එවැනි එක් විනාශකාරී ප්‍රථිඵලයක් වන්නේ රටේ අපරාධ වැඩි වීමයි. අද රටේ බොහෝ උදවිය අපරාධ වැඩිවීම ගැන කතා කරයි. එසේ වැඩිවන අපරාධ අඩුවීමට මරණීය දණ්ඩනය සහ වෙනත් බරපතල දඬුවම් දිය යුතු බවද ප්‍රකාශ කරයි. එහෙත් නඩු පමාව රටේ අපරාධ වැඩිවීමට ඉතා ප්‍රබල හේතුවක් වන බව ඒ කිසිවෙකුගේ සැලකිල්ලට භාජනයවී නොමැත.

වර්ථමාන ලෝකයේ අපරාධ නීතිය පිළිබඳව දර්ශනය හැඩගැස්වීමේ ලා ඉතා වැදගත් මෙහෙයක් ඉටුකරණු ලැබුවේ සෙසාරේ බෙකාර' නැමති ඉතාලි ජාතික නීතිවේදියෙකු විසිනි.1738 ජ 1794 යන කාලය තුළ ජීවත්වූ ඔහු 1764 අපරාධ සහ දඬුවම් ගැන' යන පොත රචනා කරමින් ප්‍රසිද්ධයට පත්විය. එය කුඩා පොතක් වූ නමුත් ඉන් අපරාධ නීතිය පිළිබඳ දර්ශණය පසුකාලීනව වෙනස් කිරීමට හේතුවිය. පසුකාලයේදී ඉතා ප්‍රබල චින්තකයන් හා විප්ලවාදීන් මෙම පොත තමන් නිතර පාවිච්චි කරනු ලැබූ බව ඔවුන් තබා ගිය සටහන් වලින් පෙන්වා දේ. ප්‍රංශ විප්ලවවාදීයෙකු වූ රෙබෙස් පියර්ද ඇමෙරිකානු ප්‍රබල දේශපාලඥයකු චින්තකයෙකු හා ජනාධිපතිවරයෙකු වූ ජෝන් කුවින්ස් ඇඩම්ස්ද සෙසාරේ බෙකාරියාගෙන් ආභාසය ලැබූවෙකි.

---

[1] බැසිල් ප්‍රනාන්දු මහතා,:"ලංකාවේ මානව හිමිකම් හා ඒවාට විසඳුම්"

සෙසාරේ බෙකාරියාගේ දර්ශණයේ ඉතා ප්‍රභලව ප්‍රකාශ වන අදහසක් වන්නේ **අපරාධ මර්ධනයට වඩා හේතු වන්නේ බරපතල දඬුවම් නොව සියළුම අපරාධ වලට සාර්ථකව හා ඉක්මනින් දඬුවම් කිරීමට ඇති හැකියාව බවයි.** උදෑහරණයක් ලෙස යම් අපරාධයක් දහස් වතාවක් යම් රටක සිදුවෙනවානම් ඉන් දෙදෙනෙකුට හෝ සුළු ගණනකට මරණීය දණ්ඩනය දීමට වඩා ඉන් වැඩි ගණනකට විරුද්ධව සාර්ථකව නඩුව අසා ඉක්මනින් දඬුවම් පැමිණවීම අපරාධ මර්දනයට ඉතා වැදගත් වන බව ඔහු පවසයි. දඬුවම අඩු එකක් වුවත් එවැනි අපරාධ තුරන්වී බොහෝ දුරට අපරාධ අඩු වීමට එය හේතු වන බවද ඔහුගේ අදහසයි. මින් ඔහු අදහස් කලේ අපරාධ හා දඬුවම් අතර හේතුඵල සම්බන්ධයක් ඇති බව සමාජයේ තහවුරු කල හැකි පමණට යුක්තිය පසිඳලීමේ විධික්‍රමය දියුණුවී එය අපරාධ අඩු කිරීමේ නොවරදින මුලෝපායක් බවට පත්වන බවයි.

මෙම දර්ශණනයෙහි පසුබිමෙහිලා ලංකාවේ අද යුක්තිය පසිඳලීමේ ඇතිවී ඇති ගැටළු දෙස බලන විට ඉතාමත් කණගාටුදායක තත්වයක් අප ඉදිරයේ මැවී පෙනේ. එනම් සාර්ථකව අවසාන වන අපරාධ නඩු එක් පැත්තකිනුත් එම අසාර්ථකව භාවයට හේතුඵල වශයෙන් සම්බන්ධවී යුක්තිය පසිඳලීමේ පමාවක් ඉතා ප්‍රභලව කැපී පෙනීමයි , අපරාධ කරුවන්ගේ පැත්තෙන් බලන විට මෙම අසාර්ථක භාවය නඩුපමාව ඔවුන්ගේ විශාල මානසික සතුටට හේතුවනවා පමණක් නොව"පුළුවන්නම් අපිව අල්ලා ගනිල්ලා" කියා ඔවුන් සමාජයට සරදම් කරමින් සිටි. එම සරදම ඉදිරයේ සියළුම නීතිවේදීන්ද වෙනත් බලධාරීන්ද සියළු රට වැසියන්ද අද ඉතා අසරණ තත්වයකට පත් කර ඇත.

අපරාධයට විරුද්ධව ප්‍රචාරක ප්‍රහාර කොපමණ තිබුණත් අද ලංකාව තුල අපරාධ මර්ධනය කිරීමට අර්ථවත් මුලෝපායක් ඇත්තේ නැත. එවැනි මුලෝපායක් පිළිබඳව පැහැදිලි කමක් ඇති කර ගැනීමත් පොදු එකගතතාවයක් ඇති කරගැනීමත් ,ඉන්පසු නිසි දේශපාලන හා වෙනත් තීන්දු මගින් එම මුලෝපාය ක්‍රියාත්මක කර ගැනීමත් අද මග හැරිය නොහැකි අවශ්‍යතාවයක් ලෙස පවතී.

**අධිකරණය ක්‍රියාවලිය පිළබඳ නීතිමය පසුබිම.**

**(a)** 1984 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සම්මත කරනු ලදුව මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ, 10 - 14 වගන්තිය දක්වා විස්තර කර ඇති මුලික අයිතීන් ආරක්ෂා කිරීමට සෑම රජයක්ම බැඳී ඇත. මෙහි 17 වන පරිච්ඡේදයේ විධායක ක්‍රියා මඟින් මුලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ප්‍රතිකර්ම මනාව විස්තර කර ඇති අතර 126 යටතේ මුලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සහ ඒ බලය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. මෙහි 126 (5) වගන්තිය මඟින් ඉක්මන් නඩු ඇසීම පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත. (ඇමුණුම් අංක 01)

**(b)** සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 18 වන වගන්තියේ (ඇ) යටතේ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව නඩු ඇසීම කල යුතු බව ප්‍රකාශ කර ඇත. තවද ICCPR යටතේ කඩවන අයිතිවාසිකම් පිළිබඳ ඒ සඳහා නියමිත පසුබිමක් මේ යටතේ මනාව විස්තර කර ඇත.

**(c)** රෝම් ව්‍යවස්ථාවේද (Rome) ICTY/ හා ICTR යුක්තිය ප්‍රමාද වීම යුක්තිය අහිමි කිරීමක් බව සඳහන් කර ඇත. එහිද ප්‍රමාද නොවී ඉක්මනින්ම නඩු අසා නිමකල යුතු බව ප්‍රකාශ කර ඇත.

**(d)** ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ( 14- 01) අප්‍රමාදව යුක්තිය ඉෂ්ඨ කල යුතු බව සඳහන් කර ඇත.

**(e)** ශ්‍රී ලංකාවේ නිති පද්ධතිය තුළ අප්‍රමාදව නඩු කාරයන් ඉටුකිරීම පහසු කිරීම සඳහා සලසා ඇති සෙසු විධානයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13- 01, 13-02 අපරාධ නඩු විධාන සංග්‍රහයේ 23,27 වගන්ති අපරාධ විධාන සංග්‍රහයේ 125, 124 යටතේ අප්‍රමාදව නඩු චෝදනා ගොනු කිරීමත් සාක්ෂිකරුවන් අධිකරණයට පැමිණීමේ ප්‍රමාදයක් ඇත්නම් වරෙන්තු කර ගෙන්වා ගැනීම, අපරාධ නඩු විභාග සංග්‍රහයේ සිවිල් නඩු විධාන සංග්‍රහ දෙකේම අධිකරණයේ නඩු කාර්ය පටිපාටිය පවත්වා ගෙන යෑමේදී එහි පියවරයන් සඳහා නිශ්චිත කාල න්‍යාමයන් නිෂ්චිතව දක්වා තිබේ. එය සිදුකර ඇත්තේ අනවශ්‍ය ලෙස ප්‍රමාදයන් සිදුවීම වැලැක්වීම සඳහාද අභියාචනයක් සඳහාද අභියාචන ඉදිරිපත් කිරීම හා පෙත්සම් ඉදිරිපත් කිරීම සඳහාද වන අතර කාලවකවානු නිශ්චිතව දක්වා ඇත.

1998 රිමාන්ඩ් බන්ධනාගාර ගතවූවන්ගේ පනත යටතේ අධිකරණ ඉදිරියේ නඩු ප්‍රමාදයට ලක්ව, රක්ෂිත බන්ධනාගාර ගතකිරීම් සඳහා නිෂ්චිත කාලසීමා යොදා ඇත. එමගින් එම පුද්ගලයන්ගේ මූලික අයිතීන් ආරක්ෂා වේ.

**1998 අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධනයන් අනුව අප්‍රමාදව නඩු ක්‍රියාත්මක කිරීම,**

1. අපරාධයට ලක්වී ඇත්තේ ළමයෙක් නම් ඔහු සම්බන්ධ සාක්ෂි / අධිකරණයට ඉදිරිපත් නොකර වීඩියෝ කැමරා මගින් ඉදිරිපත් කිරීම.
2. ළමයින් සම්බන්ධ නඩු සෘජුවම මහේස්ත්‍රාත් අධිකරණයේ විමර්ශණය නොකර සෘජුවම මහාධිකරණයට (HC) ගොනු කල යුතු ලෙස අපරාධ නඩු විධාන සංශෝධනය කිරීම.

තුන්වන පරිච්ඡේදය

**පවත්නා අධිකරණයේ නඩු ප්‍රමාද වීම සඳහා හේතු වී ඇති කරුණු**

1. පොලිසිය විසින් විමර්ශණ කටයුතු කඩිනම්ව සිදු නොකිරීම
2. වෛද්‍යවරුන් විසින් අධිකරණයේ නඩු කටයුතු සඳහා ලබා දී ඇති වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම.
3. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් විද්‍යාත්මක සාක්ෂි (Balastic) ගිනි අවි පුපුරණ ද්‍රව්‍ය මත් ද්‍රව්‍ය විද්‍යාත්මක සාක්ෂි හා විශේෂඥ සාක්ෂි ලබා දීමේදී දැඩි ප්‍රමාදයක් සිදු කිරීම.
4. දැනට නඩු විභාග කිරීම සඳහා පවත්නා ප්‍රාදේශීයව ස්ථාපනය කර ඇති අධිකරණ ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පැවතීම. (ජනගහනය හා පැමිණිලි ඉදිරිපත් කිරීම විශම ලෙස පැවතීම.)
5. අධිකරණයේ භාෂා පරිවර්තකයින් ලේඛකයින් යතුරු ලියන ශිල්පීන් වැනි කාර්ය මණ්ඩල ඌණතාවය.
6. පරිඝණක යතුරු ලියන ගබඩා පහසුකම් වැනි භෞතික උපකරණ වල පවත්නා ඌණතාවය.
7. විනිසුරුවන් ප්‍රමාණාත්මකව ප්‍රමාණවත් නොවීම.
8. අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණ කොළඹට පමණක් සීමා වීම.
9. ජනතාව නීතිය පිළිබඳව හා අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ තිබෙන අඩු දැනුවත් බව.
10. අධිකරණයේ කාර්යය පටිපාටීන් බොහෝ අවස්ථා වලදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවතීම.
11. එක් දිනකදී ඇසිය යුතු නඩු ප්‍රමාණය දැරිය නොහැකි ලෙස අධික වීම.
12. නඩත්තු/විවාහය අදාල ගැටළු සුළු සාමය කඩවීම් වැනි අධිකරණමය නොවන විසඳාගත යුතු කරුණු ඍජු ලෙසම අධිකරණය තුල විමසීම හා එම නඩු ප්‍රමාණයෙන් අධික වීම.
13. සමතකරණය/බේරුම්කරණය හා සමගීකරනය වැනි ගැටුම් නිරාකරණ ක්‍රමවේද ලෙස ජාත්‍යන්තරව පිළිගෙන ඇති ක්‍රමවේදයන් ශ්‍රී ලංකාවේ එතරම් ප්‍රචලිත නොකිරීම.
14. නීතීඥයින් හා මාධ්‍ය භාවිත කරන්නන් විසින් අප්‍රමාදීව නඩු විසදීම සඳහා තිබිය යුතු මානසික ආකල්ප දියුණු තත්වයේ නොතිබීම.

**අධිකරණයෙන් නඩු ප්‍රමාදණයන් පැවතීම නිසාවෙන් ජාතික වශයෙන් හා තනි පුද්ගල වශයෙන් මිනිසුන්ට සිදු වී ඇති හානි (මිනිසුන්ගේ අයිතීන් කඩවීම්)**

1. අධ්‍යාපනය සඳහා වෙන්ව ඇති කාලය තුල දීර්ඝ වශයෙන් පොලිස් විමර්ශන හා අධිකරණ විමර්ශන සඳහා ළමුන් දිගින් දිගටම කැඳවීම හේතුවෙන් අධ්‍යාපනය සඳහා යොමු විය යුතු කාලය අඩු වීම.

2. අකාර්යක්ෂම හා බිය දනවන සුළු ප්‍රමාද වන අධිකරණ ක්‍රියාවලිය තුල ළමා වින්දිතයින්ගේ ජීවිතයේ ඉදිරි ආකල්ප කෙරෙහි හානිදායක ලෙස බලපෑම.

3. ළමා වින්දිතයින් ප්‍රමාද වන අධිකරණ ක්‍රියාවලිය හේතුවෙන් නිරන්තරයෙන් තමනට අපරාධ සිදුකල අපරාධකරුවන් හා පොලිස් නියෝජිතයින් වෙත ඉදිරිපත් කිරීමෙන් ඔවුන් යලි යලිත් මානසික පීඩනයට පත් වීම.

4. ළමා වින්දිතයින් අධිකරණ ක්‍රියාවලිය තුල දිගින් දිගටම රැගෙන එම හේතුවෙන් මූලික වශයෙන් තම දෙමව්පියන් හා ඥාතීන්ගේ දෛනික කටයුතු අඩාල වීමෙන් ඔවුන්ගේ ආර්ථික මට්ටම බිඳ වැටීම.

5. දැඩිලෙස ප්‍රමාද වන නඩු තත්වයන් තුල ළමා වින්දිතයින් ඔවුන්ගේ ඥාතීන් හා සාක්ෂි කරුවන් නිරන්තර තර්ජනයන්ට හා බිය වැද්දවීම් වලට ලක් වීම.

6. ඉතා කෙටිකාලීන මතකයන් සහිත ළමාවිය තුල ළමයින් තමා මුහුණ දුන් නීති විරෝධී සිදුවීම තුල දීර්ඝ කාලීන අවස්ථා කිහිපයකදී සාක්ෂි ගැනීම තුල බොහෝ විට ඔවුන්ට නඩුවේ අදාල කරුණු අමතක වීම හා මග හැරීමට ඉඩ තිබීම.

7. භාෂාව හා ඥානය ඉතා වේගවත්ව වර්ධනය වන අවධිය වන ළමා කාලය තුල තමා ලක් වන අපරාධ ක්‍රියාවන් සිදුවීමේ සිට බොහෝ කලකට පසු සාක්ෂි දීමට සිදුවන නිසා මුල් ප්‍රකාශයන් පසුව අධිකරණය විසින් සිදුවන ප්‍රකාශනයන් විධි බද්ධතා (ප්‍රතිරෝධිත) උද්ගත වීම තුලින් යුක්තිය ඉටු නොවීම

8. දිගින් දිගටම අධිකරණ ක්‍රියාවලිය තුලට විවෘත වීම තුල මාධ්‍ය හා පොදු ජනතාව අතර එම ළමා වින්දිතයින් කථා බහට ලක්වීම තුල ආසියානු වටිනාකම් සහිත සංස්කෘතික පරිසරයක් පවතින ශ්‍රී ලංකාව වැනි රටක ඔවුන්ගේ සමාජ පොදු දහරාවෙන් වෙනස් කොට හෝ වෙනස් කර තැබීම යන තත්වයන්ට එම දරුවන්ට මුහුණ දීමට සිදු වීම.

9. අපරාධකරුවන් අපරාධ කල බවට චෝදනා ලැබූ පුද්ගලයින්ට අපරාධ සඳහා දඬුවම් නොලබා දික් ගැස්සූ නඩු ප්‍රමාදයන් තුල ඇප ලබා සාමාන්‍යය සමාජයන්ට එක් වීම මත එම අපරාධ කරුවන් අතරින් ඒකමාකාරයෙන් අපරාධ හෝ අපචාර එම ළමයාට හෝ වෙනත් ළමුන්ට නැවත නැවත සිදු වීමට ඇති ඉඩකඩ වැඩිවීම.

10. ළමා වින්දිතයින් හෝ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය මට්ටමින් මෙන්ම හෝ පරිපාලන වශයෙන් හෝ නෛතික වශයෙන් හෝ ප්‍රතිපාදන වශයෙන් හෝ ශ්‍රී ලංකාව තුල යන්ත්‍රයක් නොමැති අතර එක් නඩුකාරයෙකුට මුණදුන් ළමා වින්දිතයින් තමා ගොදුරු වූ දුෂ්කර අත්දැකීමෙන් වෙන්වී යලිත් සාමාන්‍ය පුරවැසියකු ලෙස සාර්ථක ජීවිතයකට මුණදීමට ඇති ඉඩකඩ ඇහිරීම.

11. දීර්ඝ වශයෙන් ප්‍රමාදවන නඩු විභාගයන් තුල පැමිණිලි හා සාක්ෂි නඩු ඉල්ලා අස්කර ගැනීමට පෙළඹීම.

12. නඩු විභාගකිරීම දීර්ඝ වශයෙන් ප්‍රමාදවන තත්වයන් තුල නඩුවට අදාල නඩු භාණ්ඩ හා ලේඛණ ගත සාක්ෂි විනාශ වී යාමට තිබෙන ඉඩ වැඩිවීම මගින් යුක්තිය පසිඳලීම අසාර්ථක වීම.

හතරවන පරිච්ඡේදය

## **ක්‍රමවේදය**

දත්ත හා තොරතුරු එකතු කිරීමේදී මූලික වශයෙන් පහත සඳහන් ක්‍රමවේදයන් භාවිතා කරන ලදී.

A. ප්‍රාථමික දත්ත එකතු කිරීම

මේ සඳහා ආසියානු මානව හිමිකම් කොමිසම මගින් නිකුත් කරන ලද අර්ජන්ට් ඇපීල් (Urgent Appeals) හා News letters අධ්‍යයනය කිරීම. මීට අමතරව අ. මා. හි. කො. බද්ධ ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන වලින් අදාල තොරතුරු ගොනු කිරීම.

B. ද්විතියික දත්ත එකතු කිරීම

- තෝරාගත් අදාල වින්දිතයන් සමග හා ඔවුන්ගේ පවුල් සමග සම්මුඛ සාකච්ඡා පවත්වීම.
- මීට අමතරව සත්‍ය වශයෙන්ම ලංකාවේ නඩු ප්‍රමාදයක් පවතීද යන්න පිළිබඳව කරුණු ගොනු කිරීමට නීතීඥවරුන් සඳහා ප්‍රශ්ණාවලියක් සකසා එය නීතීඥවරුන් 15 දෙනෙකුට ලබා දී අදාල තොරතුරු ගොනු කිරීම .
- අදාල ආයතන වල අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා පවත්වන ලදි.

## **දත්ත හා තොරතුරු ඉදිරිපත් කිරීම**

මෙම යටතේ මූලික වශයෙන්ම ගොනු කල දත්ත හා තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. විශේෂයෙන් ප්‍රාථමික දත්ත ඉදිරිපත් කිරීමේදී අදාල සිද්ධිය සාරාංශ ගත කර ඉදිරිපත් කරන අතර සම්පූර්ණ අදාල සිද්ධිය ඇමුණුම් යටතේ ඉදිරිපත් කරනු ලැබේ. දෙවනුව එක් එක් සිද්ධියට අදාල වින්දිතයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකාවන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවන්ගේ තොරතුරු ගොනු කරනු ලැබේ.

තෙවනුව නීතීඥවරුන් සඳහා බෙදා දුන් ප්‍රශ්ණාවලියේ තොරතුරු ප්‍රස්ථාර ගත කර ඉදිරිපත් කරනු ලැබේ.

## සිද්ධීන් ඉදිරිපත් කිරීම

[2]සිද්ධි අංක 01

| | | |
|---|---|---|
| වින්දිතයාගේ නම | :- | [3]සීතා |
| වයස | :- | අවුරුදු 16 |
| සිද්ධිය වූ දිනය | :- | 2001 අගෝස්තු 12 |

සිද්ධිය

සීතා වයස අවුරුදු 16 ක තලවකැලේ දෙමළ මහා විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යාවකි. 2001 අගෝස්තු 12 වන ඉරු දින දහම් පාසල් නිම වී සවස 02.00 ට පමණ තම නිවසට යාමේදී රමීස් හා පියල් නාලක යන පුද්ගලයින් දෙදෙනා ඇයව බලහත්කාරයෙන් ගෙන ගොස්, වාහනය තුලදී ඇයව දූෂණය කරන ලදී. පසුව ඇයව තලවකැලේ හිංදු කෝවිල ලඟින් බස්සවා ඇත. ඇය 10 වන පංතියේ ශිෂ්‍යාවක් වන අතර ඇයට සිංහල භාෂාව වචනයක් හෝ කථා කිරීමට නොහැක. කෙසේ නමුත් ඇය පොලීසියට සිද්ධිය පිළිබඳ වාර්තා කර අදාල අපරාධ කරුවන් දෙදෙනාව හඳුනාගෙන ඇති අතර, පොලිසිය විසින් ඔවුන්ව අත්අඩංගුවට ගන්නා ලදී.

පසුව ඇයව කොටගල රෝහලට ඇතුලත් කර ඇති අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා නුවරඑළිය රෝහලට මාරු කර ඇත. ඇය අගෝස්තු 16 වන දින රෝහලෙන් ටිකට් කපා නිවසට ගිය අතර අදාල සැකකරුවන් අගෝස්තු 28 වන තුරු රිමාන්ඩ් භාරයේ තබන ලදී.

මෙම සිද්ධිය අගෝස්තු 28 වන දින උසාවියට ඉදිරිපත් කල අවස්ථාවේදී සීතාගේ නීතීඥ ප්‍රියන්ත ගමගෙ මහතා අදාල සැකකරුවන්ට ඇප නොදෙන ලෙස ඉල්ලා සිටි අතර දේශපාලන බලපෑම් මත අවසානයේ කෙසේ හෝ අදාල සැකකරුවන්ට ඇප ලබා දී ඇත. අවාසනාවකට මෙන් උසාවිය තුලදී ඇයව දෙවැනි වර දූෂණයට ලක් වුයේ මුදල් මත හා දේශපාලන බලය මත සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතීඥ රාජපක්ෂ මහතා ප්‍රසිද්ධියේ උසාවිය තුල ඇයගෙන් ඇසූ ප්‍රශ්ණ හේතුවෙනි. මෙහිදී පෙනී ගිය කරුණක් වී ඇත්තේ පොලිස් නිළධාරීන්ද අදාල සැකකරුවන් වෙනුවෙන් ඔවුන්ව ආරක්ෂා වන ලෙස කටයුතු කිරීමයි

---

[2] AHRC; "Urgent Appeal"; "http://www.ahrchk.net/ua/mainfile.php/2001/161/", Up dates; "http://www.ahrchk.net/ua/mainfile.php/2004/651/ "

[3] සැ.යු: ඇයගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා මනංකල්පිත නාමයක් යොදන ලදී

**වර්තමාන තත්වය :-**

ඇයව මහනුවර විදුහලකට යවා පාසල් අධ්‍යාපනය ලබා දී ඇති අතර (ඇයව රැක බලා ගත් ආයතනයේ නම අධ්‍යක්ෂක තුමාගේ ඉල්ලීම පරිදි ඉදිරිපත් නොකෙරේ) ඇය දැනට කටුනායක ඇඟළුම් කම්හලක සුපරීක්ෂක වරියක් ලෙස සේවය කරනු ලබයි. ඇයගේ පියා නොමැති අතර සීයාගේ හා මවගේ රැකවරණය යටතේ ඇය ජීවත් වී ඇත.

ඇයට වුණු අසාධාරණය වෙනුවෙන් වන්දි ඉල්ලා මහේස්ත්‍රාත් උසාවිය වෙත දැමූ නඩුව 21 වතාවක් අසන ලදි. නමුත් එය තවමත් අවසානයක් දක්වා පැමිණ නොමැත. මීළඟ නඩු වාරය 2007 ජනවාරි 17 වන දින නුවරඑළිය මහේස්ත්‍රාත් උසාවියේදී ඇසීමට නියමිතය.

අවාසනාවකට මෙන් අවුරුදු 06 කට ආසන්න කාලයක් තුල ඇයගේ දූෂණ නඩුව ඉහළ උසාවියේ ඇසීමට තවමත් පියවර ගෙන නොමැත.

***අවාසනාවන්ත ඉරණමට ගොදුරු වූ බාලවයස්කාර ළඳැරිය රීටා සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවෙන් හෙළි කල කරුණු (මෙම අත්දැකීම ඉතාමත් කණගාටුදායක බව කිව යුතුය)***

- ඇයගේ වර්තමාන වයස අවුරුදු 21 කි.
- දැනට ඇය කටුනායක ඇඟළුම් කම්හලක සුපරීක්ෂකවරියක් ලෙස වැඩ කරනු ලබයි.
- ඇයගේ පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 03 කි. සීයා, අම්මා හා ඇයට බාල සහෝදරයෙක් සිටියි.
- **ඇයගේ වචන වලින් ඇයගේ අත්දැකීම් මෙසේය.**

මා නිරන්තර දූෂණයට ලක් වෙනවා. මම උසාවි යන සෑම විටම මගෙන් ප්‍රසිද්ධියේ අසන ප්‍රශ්ණ නිසා මම ලැජ්ජාවටත් වේදනාවටත් පත් වෙනවා. මම කැමතිම නැත්තේ උසාවි යන්න. මට සිද්ධිය මතක් වෙන සෑම විටම, මාව දූෂණය කල අයව දකින සෑම විටම මට බය හිතෙනවා. මට දැන් පවුලක් ලෙස එකට ජීවත් වෙන්න බෑ. නඩුව ඉල්ලා අස්කර ගන්න කියලා බලපෑම් එනවා. මම හැංගිලා ජීවත් වෙන්නේ. මාගේ දෙමව්පියන් සමඟ පවුලක් ලෙස ජීවත් වීමේ අයිතිය මට දැන් නෑ. මම කී වතාවක් උසාවි ගියාද? මාව දූෂණය කරපු අය හොඳින් ඉන්නවා. එයාලා මම වගේ වේදනා විඳින්නේ නෑ. මම මගේ නඩුව අද ඉවර වෙයි හෙට ඉවර වෙයි කියලා බලාගෙන ඉන්නවා. තවම ඉහළ උසාවියේ නඩුව පටන් ගත්තෙවත් නෑ. අසරණ අපට තමා අසාධාරණකම් වෙන්නේ. මමත් ආසයි ලස්සන පවුලක් ගෙන යන්න. නමුත් දැනට ඒක හීනයක් විතරයි. මාගේ අධ්‍යාපන කටයුතු නතර වෙන්නේ නැතිව (නම කපන ලදී) පින් සිද්ධ වෙන්න මට හමාර කරගන්න පුළුවන් වුණා. මම රැකියාව කරන්නේත් සියල්ල හංගාගෙනයි. මාගේ එකම ප්‍රාර්ථනාව මට වුනා වගේ කිසිම ගැහැණු ළමයෙකුට මෙවැනි අපරාධයක් වෙන්න එපා කියලයි. මගේ ළමා කාලයම ඉවර වුනා. ඉක්මනින් අදාල සැකකරුවන්ට දඬුවම් ලැබී නඩුව ඉවර වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

[4]සිද්ධි අංක 02

වින්දිතයාගේ නම :- [5]අංජලී

වයස :- අවුරුදු 16

සිද්ධිය වූ දිනය :- 2003 ජුලි 02

සැකකරුවන් :- ඩේවිඩ් කේසර(අවු:21), රවිනාතන් (අවු:38)

සිද්ධිය වූ ස්ථාන :- කෙංගල්ල, දිගන

**සාරාංශගත සිද්ධිය**

2003 පෙබරවාරි 23 වන දින අදාල සැකකරු වන ඩේවිඩ් ඔහුගේ මෝටර් රථයට අංජලීගේ අත වද්දන ලදී. ඒ ඇය පරිෂණක පංති සඳහා යන අතරතුරේදීය. පසුව ඩේවිඩ් දෙවතාවක් ඇය පරිෂණක පංති යන විටදී හමු වී කතා කර ඇත.

2003 ජුලි 02 දින ඩේවිඩ් ඇයව සවස 03.30 ට පමණ මහනුවර රැජින හෝටලය ලඟදී හමුවී ඇයට බීමට කොකාකෝලා එකක් දී ඇත. එය පානය කල පසුව ඇය මත් වී ඇත. ඇයට නැවත ගෙදර යාමට අවශ්‍ය වුවත් ඩේවිඩ් ඇයව වෑන් රථයට දමා කෙංගල්ලේ නිවසට රැගෙන ගොස් ඇති අතර පළමුව ඩේවිඩ් විසින් ඇයව දූෂණය කර ඇත. දෙවනුව ඔහුගේ මාමා වන රවිනාදන්ද ඇයව දූෂණය කර ඇත. මුළු රාත්‍රියේම ඇයව එම නිවසේ රඳවා පුද්ගලයින් පස් හය දෙනෙකුම ඇයව දූෂණය කර ඇත. ඇයට බලහත්කාරයෙන් මත්ද්‍රව්‍ය දී ඇති අතර අදාල සියළුම සැකකරුවන් හඳුනා ගැනීමට ඇයට නොහැකි වී ඇති අතර පසුදා උදෑසන 10 වන තුරුම ඇයට සිදු වූයේ කුමක්දැයි මතකයක් තිබී නැත. මෙම කණ්ඩායම අතර පේරාදෙණිය රෝහලේ වෛද්‍යවරයෙකු වන අවුරුදු 54 වයසැති ආතර් කුලරත්නද සිට ඇති අතර ඔහුද කණ්ඩායමේ අනිකුත් සාමාජිකයින් සමඟ මත්ද්‍රව්‍ය පානය කර ඇත. ඔහු ඇයව දූෂණය කලේද යන්න පිළිබඳව ඇයට මතකයක් නොමැත. ජුලි 03 වන දින උදෑසන වාහනයේ රියැදුරු රාජා, ඩේවිඩ් ඇතුළු පිරිස ඇයව පේරාදෙණිය නගරයට ගෙනගොස් ඇරලා ඇති අතර එතැන් පටන් ඇය තනිවම තම නිවසට ගොස් ඇත. ඇයගෙන් තොරතුරු දැනගත් ඇයගේ මව ඇය සමඟ පේරාදෙණිය පොලිස් ස්ථානයට ගොස් සිද්ධිය පිළිබඳව පැමිණිලි කර ඇත. සිද්ධිය පිළිබඳ විස්තර දැනගත් පේරාදෙණිය පොලිස් නිළධාරීන් මේ පිළිබඳව මහනුවර පොලිසියට පැමිණිලි කරන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව මහනුවර පොලිස් ස්ථානයට අදාල සිද්ධිය පිළිබඳව පැමිණිලි කර ඇත. එදිනම අංජලී ඇයගේ මව ඇයගේ නැන්දා පොලිස් නිළධාරීන් සමඟ ඩේවිඩ්ව සෙවීමට ගිය අතර ජුලි 04 වන දින ඇයව රඳවා තිබූ නිවස ඇය හඳුනා ගන්නා ලදී. පසුව ඇයව මහනුවර රෝහලට ඇතුලත් කර ඇති අතර ඇය ජුලි 10 වන දින වන තුරු නේවාසිකව ප්‍රතිකාර ගෙන ජුලි 10 වන දින නිවස බලා පිටත් වී ඇත. රෝහලින් පිටවූ පසු මහනුවර පොලිස් ස්ථානයට ගොස් පොලිසියේ ඉල්ලීම පිට වාර්ථාවක් ඉදිරිපත් කර ඇත.

---

[4] AHRC; "urgent Appeal", "http://www.ahrchk.net/ua/mainfile.php/2004/595/"

[5] සැ.යු: ඇයගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා මනංකල්පිත නාමයක් යොදන ලදී

පොලිස් ස්ථානයේදී පොලිස් නිළධාරී අබේසිංහ මහතා හා අපරාධ පිළිබඳ පොලිස් ස්ථානාධිපතිතුමා වන ධර්මරත්න මහතා පැමිණිල්ල වෙනස් කරන ලෙස ඇයට බලපෑම් කර ඇත. තවද රවිනාදන් ඇයව විවාහ කර ගැනීමට කැමති බවද දන්වා ඇත. නමුත් ඇය එකම පැමිණිල්ල නැවතත් කර ඇත. පොලිස් නිළධාරීන් අදාල සමහර කොටස් වාර්ථාවෙන් අයින් කර ඇත. හඳුනා ගැනීමේ පෙරට්ටුව 2003 අගෝස්තු 06 වන දින පැවති අතර වාසනා සහ ප්‍රීති යන දෙදෙනාව ඇය හඳුනාගෙන ඇත. එම දෙදෙනාව අත්අඩංගුවට ගෙන ඉක්මනින් ඇපමත නිදහස් කර ඇත. ලැබී ඇති තොරතුරු අනුව ඩේවිඩ් හා රවිනාතන් ස්විට්සර්ලන්තයේ සිද්ධාලේප සමාගමේ කොටස් කරුවන්ය. පොලිස් නිළධාරීන් ප්‍රධාන සැකකරුවන් දෙදෙනා වන ඩේවිඩ් හා රවිනාතන් අත්අඩංගුවට ගැනීමට ජූලි 03 හා 04 වන දිනයන්හි ගිය මුත් ඒ වන විටත් ඔවුන් ලංකාවෙන් පිට වී ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යන සෑම අවස්ථාවකදීම පොලිස් නිළධාරීන් අංජලීගේ මවගෙන් ඉන්ධන ගැසීම සඳහා මුදල් ඉල්ලා ඇත. තවද අදාල සැකකරුවන් ධනවත් බැවින් ඔවුන්ව නීතියේ ඉදිරියට ගෙන ඒමට නොහැකි බව පොලිස් නිළධාරීන් විසින් පවසා ඇත.

**අංජලී සමග කල සාකච්ඡාවේදී හෙළි කල කරුණු :-**

දැන් මගේ වයස අවුරුදු 21 යි. 10 වතාවක් විතර මම උසාවි ගියා. හැමදාම නඩුව කල් යනවා. දින ලැබෙන එක විතරයි වෙන්නෙ. තවම නඩුව විභාග කිරීමට නොහැකි තත්වයක් උදාවෙලා තියෙන්නෙ. ප්‍රධාන සැකකරුවන් රටෙත් නැහැ. මොනවා වෙනවද කියලා මට නම් තේරෙන්නෙ නැහැ. අපි රෑට අපේ ගෙදර ඉන්නෙ නැහැ. ආරක්ෂාව සඳහා නැන්දලාගේ ගෙදර යනවා. මම මානසිකව වැටිලා ඉවරයි. හැමදාම වේදනා විදිනවා. මම නිසා අපේ අම්මා ඉන්නේ හරිම දුකෙන්. මම කොහෙවත් දැන් තනියම යන්නෙ නැහැ. මට බයයි. මගේ නිදහස සම්පූර්ණයෙන්ම සීමා වෙලා තියෙන්නෙ. මගේ පංති යාමත් අතර මග නතර වුනා. මට අනාගතයක් නෑ කියලා හිතෙනවා. අසාධාරණකම් කරන මිනිස්සුන්ගේ සල්ලි වලට පොලීසියත් යටත් වෙලා. මට නාකි මනුස්සයාව බඳින්න කිව්වා. පොලීසිය තියෙන්නේ අසාධාරණකම් වලට එරෙහිව වැඩ කරන්න. සාධාරණය ඉෂ්ඨ කරන්න. අපි දුප්පත් නිසාද අපට මෙහෙම සලකන්නෙ. ඇත්තම කියනවානම් මම දැන් සමාජයට තනියම යන්න බයයි. මේ නඩුව ඉක්මනින් ඉවර වෙලා සාමාන්‍ය කෙනෙක් විදිහට සමාජයේ ජීවත් වෙන්න ලැබෙන්න කියන එක තමයි මගේ එකම ප්‍රාර්ථනාව.

**ඇයගේ මව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවෙන් හෙළි කල කරුණු :-**

මට දුවලා දෙදෙනෙක් ඉන්නවා. වැඩිමහල් දුවට තමයි මේ අපරාධය වුනේ. මම අනික් දුව ගැනත් හරිම බයෙන් ඉන්නේ. සමාජය හරිම නපුරු වෙලා. මම දැන් මගේ ළමයි යන හැම තැනම එයාලත් එක්කම යනවා. ලොකු දුවගේ අනාගතය ගැන මට හරි බයයි. ඇයට තර්ජන එයි කියලා ගොඩක් බයයි. පොලිස් නිළධාරීන් සිටින්නේත් අපරාධකරුවන්ගේ පැත්තෙ. ඉතින් අපිට සාධාරණයක් ඉෂ්ඨ වෙයි කියලා හිතන්න අමාරුයි. ප්‍රධාන සැකකරුවන් දෙදෙනා ලංකාවෙ නෑ. දින ලැබෙනවා විතරයි. නඩුව කල් යනවා. මගේ දුවගේ ළමා කාලෙ ඉවරයි. ළමයින්ව ආරක්ෂා කිරීමට හැමෝම බැඳී සිටිනවා. නමුත් මගේ දුවව විනාශ වෙලා ඉවරයි. ඉක්මනින්ම මේ නඩුව ඉවර වෙනවට මම කැමතියි. දුව සහ අපි පවුලේ සියළු දෙනාම මැරි මැරී ඉපදෙනවා. හැම අම්මා කෙනෙකුම වගේ මමත් කැමතියි මගේ දුව හොඳ වැදගත් විදිහට විවාහ දිවියට ඇතුලත් වෙනවා දකින්න. නමුත් දැන් මට ඒක හීනයක් විතරයි. සමහර වෙලාවල් වලට අපේ ආරක්ෂාව ගැනත් මට බයයි. නඩු ප්‍රමාදය සඳහා කුමක් හෝ කල යුතුයි. දුව වේදනා විදිනවා බලන් ඉන්න

මට බැහැ. ඒ නිසා මම හැම වෙලාවකදීම ඇයව සතුටින් තියන්න තමයි උත්සහ කරන්නෙ. ඇයි මිනිස්සු මෙහෙම අපරාධ කරන්නෙ. එයාලටත් අම්මා කෙනෙක් හා සහෝදරියෝ ඇති නේද.

ළමයින්ගෙ ගරුත්වය ආරක්ෂා කිරීමට හැමෝම බැඳී සිටිනවා. නමුත් එහෙම වෙනවද? වැරදිකරුවන් වෙනුවෙන් දෙන දඬුවම් ඉතාමත් අඩුයි. නීතිය ආරක්ෂා කරන මිනිස්සුම නීතිය කඩ කරන කොට අපි මොනවද කරන්න ඕනා. ඉක්මනින් නඩු ඉවර වුනේ නැතිනම්, අපරාධකරුවන්ට නිසි දඬුවම් නොලැබුනොත් ඔවුන් නැවතත් එම අපරාධය කිරීමට පෙළඹෙනවා නේද. රටේ නීතිය ආරක්ෂා කරන නිළධාරින් ඇයි මෙහෙම කරන්නෙ. ඇයි ටිකක් මානුෂික පැත්තෙන් බලන්නෙ නැත්තෙ. ජීවත් වීමට තියෙන අයිතියට පවා තර්ජන එල්ල වෙනවා. මේ පිළිබඳ ඉහල නිළධාරීන්ගේ අවධානය යොමු කර ඉක්මනින් නඩු ඇසීමක් තුලින් අපරාධකරුවන්ට නිසි දඬුවම් ලබා දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

**[6]සිද්ධි අංක 03**

| | | |
|---|---|---|
| වින්දිතයාගේ නම :- | | [7]මදුමාලි (08 වසර ) |
| වයස | :- | අවුරුදු 13 |
| සිද්ධිය වූ දිනය | :- | 2002 සැප්තැම්බර් 26 |
| සැකකරු | :- | අවුරුදු 37 වන ඇයගේම පියා |

**සිද්ධිය**

මදුමාලී අවු : 13 ක් වයසැති 08 වසරේ ඉගෙනුම ලබන පාසල් ශිෂ්‍යාවකි. 2002 සැප්තැම්බර් 26 වන දින මදුමාලීගේ මව (අවු : 34) තම ස්වාමි පුරුෂයා තම දුවව දූෂණය කරන අයුරු තම ඇස් දෙකෙන්ම දැක ඇත. ඇයව සැප්තැම්බර් මස 02 වන දින සිට තම පියා විසින් 06 වතාවකට වඩා දූෂණයට ලක් කර ඇත.

2002 සැප්තැම්බර් මස 27 වන දින මදුමාලීගේ මව විසින් අදාල සිද්ධිය පිළිබඳව පොලීසියට වාර්තා කර ඇති අතර 2002 සැප්තැම්බර් මස 27 වන දින සැකකරු වන මදුමාලීගේ පියාව මහනුවර පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන මැණික්හින්න පොලීසියට භාර දෙන ලදී. අදාල සැකකරුව ඔක්තෝබර් මස 11 දින දක්වා රිමාන්ඩ් භාරයේ රඳවා උසාවියට ඉදිරිපත් කරන ලදී. ඔහුට අවුරුදු 11 ක පුතෙක්ද සිටියි. ඔවුන්' අවුරුදු 03 ක පමණ කාලයක සිට පල්ලකැලේ පදිංචිව සිට ඇත.

පළමුවෙන්ම මදුමාලිව ඇයගේ පියා විසින් දූෂණය කරන ලද්දේ 2002 සැප්තැම්බර් මස 02 වන දින ඇයගේ මව කොළඹ ජනබල මෙහෙයුමට සහභාගී වීමට ගිය අවස්ථාවේදීය. මදුමාලිගේ පියා ඔහුගේ පුතාව රාත්‍රී 08.00 ට පමණ කඩයට යවා මදුමාලිට පිහියක් පෙන්වා ඇයව බය කර දූෂණය කර ඇත. අවුරුදු 13 ක් වයස වන ඇය තම

---

[6] AHRC, "Urgent Appeal", "http://www.ahrchk.net/ua/mainfile.php/2002/314/"

[7] සැ.යු: ඇයගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා මනංකල්පිත නාමයක් යොදන ලදී

පියාගේ තරම දන්නා අතර ඔහු නිරන්තරයෙන් බීගෙන තම මවට පහර දෙන අන්දම ඇය දැක ඇති නිසා ඔහුට බය වී ඇත. ඇයව මහනුවර රෝහලේ වෛද්‍ය පර්යේෂණ සඳහා දින 04ක් පමණ නේවාසිකව රදවා ඇත. ඇයගේ මව පවසන අන්දමට දහවල් කාලයේදීත් අදාල සිද්ධිය මතක් වන විට ඇය තනියම කෙඳිරි ගාමින් වේදනා විඳිනු බවයි. දැනට මදුමාලි මහනුවරට ආසන්න විද්‍යාලයක ඉගෙනීමේ කටයුතු කරගෙන යනු ලැබේ.

මදුමාලිගේ ජීවිතයට අනතුරක් වේයයි බියෙන් ඇයගේ මව විසින් මදුමාලිව පාසලෙන් අස් කරගත් අතර දැනට ඇය මානව හිමිකම් ක්‍රියාකාරීන් යටතේ රැකවරණය ලබමින් තම ඉගෙනීම් කටයුතු කරගෙන යනු ලැබේ.
කෙසේ නමුත් මදුමාලි හා ඇයගේ මව තමන්ගේ ආරක්ෂාව පිළිබඳ ඉතා බියෙන් පසු වෙයි. දැනට මෙම නඩුව ඉහළ උසාවියේ 09 වතාවක් පහත දිනයන්හි අසා ඇත. 2006 ජනවාරි 23, 2006 පෙබරවාරි 02, 2006 පෙබරවාරි 22, 2006 අප්‍රේල් 25, 2006 මැයි 30, 2006 අගෝස්තු 16, 2006 සැප්තැම්බර් 19 හා 2006 දෙසැම්බර් 07 යන දිනයන්හිදීය.

**මදුමාලි සමග සාකච්ඡා කිරීමේදී ගත් තොරතුරු :-**

ඇයගේ ස්වභාවය පිළිබඳව පළමුවෙන්ම කරුණු ඉදිරිපත් කල යුතුය. ඇය වැඩිපුර කතා නොකරන ළමයෙකි. ඉතා අහිංසක පෙනුමක් ඇති ඇය නිතරම කල්පනා කරමින් සිටින ස්වභාවයක් දක්නට ඇත. ඇයගෙන් ලබා ගත් තොරතුරු අනුව ,

1. ඇය තම නිවසට යාමට හෝ පියාව දැකීමට කිසිම ආසාවක් නැත.
2. ඇය නිරන්තර බියෙන් පසු වෙයි.
3. දෙමාපිය ආදරය හා සෙනෙහස නොමැති නිසා ඇය ඉතා වේදනාවෙන් ජීවත් වෙයි.
4. පාසල් ගමන අවසාන වූ පසු ඇයට කුමක් සිදුවේද යන්න පිළිබඳව ඇය ඉතා බියෙන් පසු වෙයි.
5. නඩුවේදී තම පියා නිදහස් වුවහොත් ඇයගේ හා මවගේ ජීවිතයට තර්ජනයක් වේ යයි ඇය නිතරම සිතයි.
6. තම එකම සහෝදරයා සමග එකට සිටීමට නොහැකි වීම පිළිබඳව ඇය කණගාටු වේ.
7. ඇයගේ අධ්‍යාපන කටයුතු වලට මෙම තත්වය බාධාවක් වී ඇත. ඇයට අමතක වීම හා පාඩම් කෙරෙහි අවධානය යොමු කිරීමට අපහසු වී ඇත. (ඇය මෙවර අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට ඇත)
8. නඩුවට යාමට දින දෙකක් තිබියදී ඇය නිරන්තරයෙන් ලෙඩ වෙයි. මෙම තත්වය ඇයගේ අධ්‍යාපන කටයුතුවලට බොහෝ සෙයින් බලපා ඇත.
9. උසාවි භූමිය තුල තම පියාව දැකීම තුලින් ඇයගේ මානසිකත්වය (නැවත නැවතත් කම්පනයට ලක් වීමෙන්) බිඳ වැටී ඇත.

සැ:යු :- ඇයව නිරන්තරයෙන්ම මානසික උපදේශක වරයෙකුගේ අධීක්ෂණයට යටත්ව
තිබීමට සිදු වී ඇත.

**මදුමාලිගේ මව සමඟ කල සාකච්ඡාවෙන් ගොනු කල කරුණු :-**

මාගේ ස්වාමි පුරුෂයාගේ ක්‍රියා කලාපය නිසා මට දැන් පවුල් ජීවිතයක් නැහැ. පවුල කැඩී විසිරී ගොස් ඉවරයි. මම දැන් ස්වාමිපුරුෂයාගෙන් වෙන් වීමට දික්කසාද නඩුවක් දමා තිබෙනවා. නමුත් ජීවිතය පිළිබඳ ඉතා බියෙන් පසු වෙනවා. මගේ දුව නැවත ගෙදර එමට ඉතා බයයි. පුතා දුව නැති නිසා ඉතා හුඟාක් සාංකාවෙන් ඉන්නෙ. දුවත් එහෙමයි. මෙම තත්වය ළමුන් දෙදෙනාටම බලපා තිබෙනවා. දුව මා ළඟ ඉන්න කාලයේදි දවල්ටත් කල්පනා කර කර හුල්ලනවා, කෙඳිරිගානවා. ළමයා හුඟාක් නිශ්ශබ්ද ළමයෙක් වුනා. මම විතරක් නෙවෙයි ළමයි දෙදෙනාම මානසිකව දුක් විඳිනවා. ළමයින්ගේ අනාගතය පිළිබඳ මට බයයි. මොනවා වෙයිද කියලා මට හිතා ගන්න බෑ. 2002 සිට තවම මේ වේදනාව අපි විඳිනවා. තවම නඩුව ඉවර නෑ. අපිත් බලාගෙන ඉන්නවා. එක දිගට මෙම නඩුව අහලා ඉවර කරනවනම් ඉවරයි. මේ තත්වය යටතේ දුවගේ ඉගෙනීම කෙරෙහි සුභදායි බලාපොරොත්තුවක් තියාගන්න බෑ. පුතාත් හුඟක් මානසිකව දුක් විඳිනවා. මේ හැම ප්‍රශ්ණයක්ම ඉක්මනින් විසඳිලා මට දුව හා පුතා සමඟ එකට ජීවත් වීමට ඇත්නම් හුඟක් හොඳයි. එක වෙලාවකට හිතෙනවා පොලීසි ගියේ අපරාදේ කියලා. රස්තියාදු වෙලා දැන් මට ඇති වෙලා. ඇයි මෙහෙම දේවල් වෙන්නෙ. ඉක්මනින් මේ දේවල් ඉවර වෙනවා දකින්නයි මගේ එකම බලාපොරොත්තුව.

**[8]සිද්ධි අංක 04**

| | | |
|---|---|---|
| වින්දිතයාගේ නම | :- | දවුන්දගේ පුෂ්පකුමාර (වයස අවුරුදු 14) |
| ලිපිනය | :- | 21 කණුව, රණවරපිටිය පාර, සාලියවැව හන්දිය, පුත්තලම |
| සැකකරුවන් | :- | සාලියවැව පොලිස් ස්ථානාධිපති හා අනෙකුත් නිළධාරීන් |
| වධහිංසාවට ලක් වූ දිනය | :- | 2003 සැප්තැම්බර් 01 වන හා 02 වන දින |

**සිද්ධිය**

2003 සැප්තැම්බර් මස 01 වන දින රාත්‍රී 10.00 ට පමණ සාලියවැව පොලිස් ස්ථානයේ නිළධාරීන් 06 දෙනෙකු පමණ පුෂ්පකුමාරගේ සහෝදරියගේ නිවසට පැමිණ තර්ජනය කර පුෂ්පකුමාරගෙන් කට උත්තරයක් ගැනීමට ඇතැයි පවසා බලහත්කාරයෙන් ජීප් රථයට දමා ගෙන ගොස් ඇත. මේ අවස්ථාවේදී අදාල ජීප් රථයේ මත්පැන් බෝතල් 04 ක් තිබී ඇති බවත් ඒ අවස්ථාවේ පොලිස් නිළධාරීන් බීමතින් සිටිය බවත් පසුව අණාවරණය වී ඇත. ජීප් රථයට දමා ගත් පුෂ්පකුමාරට පොලිස් නිළධාරීන් විසින් පහර දී මාලයක් ගත් බවට ඔහුට පාපොච්චාරණය කරන මෙන් බල කර ඇත. ඔහුව සාලියවැව පොලිස් ස්ථානයට ගෙන ගොස් කූඩුවට දමා ඇති අතර පුෂ්පකුමාරගේ දෑත් පිටුපසට බැඳ පොලිසියේ බාල්කයේ එල්ලා නැවතත් ඔහුට පහර දී ඇත. පසුව පුෂ්පකුමාර දෑත් බැඳ කුහුඹුවන් සිටින කාමරයකට දමන ලදී.

පුෂ්පකුමාරගේ දෙමාපියන් පොලිස් ස්ථානයට යනවිට ඔහුව එල්ලා තිබෙන අයුරු දැක ඇති අතර පුෂ්පකුමාරව බැලීමට අවසර ඉල්ලූ විට O.I.C. මහතා නැති බව පවසා පසුවදා ඔවුනට නැවත පැමිණෙන ලෙස දන්වා ඇත. මේ අවස්ථාවේ

[8] AHRC, "Urgent appeal"; "http://www.ahrchk.net/ua/mainfile.php/2003/539/"

මාලය අයිතිකරු පුද්ගලයින් 10 ක් 15ක් සමග පැමිණ මාලය නොදුන්නොත් පුෂ්පකුමාරට හිරිහැර කරන ලෙස පොලිස් නිළධාරීන්ට තර්ජනය කර ගොස් ඇති අතර මේ පිළිබඳව පොලිස් නිළධාරීන් කිසිම පියවරක් ගෙන නොමැත.

පසුදා උදෑසන එනම් සැප්තැම්බර් 02 වන දින පුෂ්පකුමාරගේ මවට හා සහෝදරියට ඔහු සමග කතා කිරීමට ඉඩ දී ඇති අතර මේ අවස්ථාවේ පුෂ්පකුමාර ඔහුගේ දෑත් වල ඇති තුවාලත්, කකුල කුම්බි කා ඇති වූ තුවාලත් පොලිස් නිළධාරීන්ගේ වධ හිංසාවට ලක් වී තුවාල වුනු හිස හා පපුව ඔවුන්ට පෙන්වා ඇත. මේ අවස්ථාවේදී O.I.C. පුෂ්පකුමාරගෙන් මාලය ගත්තාදැයි නැවත අසා ඔහු නෑ කියු විට මව සමග ගෙදර යාමට අවසර දී ඇත. පුෂ්පකුමාර ගෙදර පැමිණි පසු ඔහුට ඔළුවේ කැක්කුම සෑදී ක්ලාන්තය වී ඇත. පසුදා උදෑසන පුෂ්පකුමාරව පුත්තලම රෝහලට ඇතුලත් කර ඇත.

සැප්තැම්බර් 05 වන දින පොලිස් නිළධාරීන් විසින් නියම සැකකරු අල්ලා ගත් බවත් පුෂ්පකුමාර හොරකම් කර නොමැති බවත් ඔහුගේ මවට පවසා ඇත. තවද පුෂ්පකුමාරව රෝහලින් ගෙදර ගෙන එන ලෙසත් ඉල්ලා මාල අයිතිකරුගෙන් පුෂ්පකුමාරගේ මවට රු: 1000/= ක් දී රාත්‍රී 7-8 අතර බලෙන් පුෂ්පකුමාරව ටිකට් කප්පවා ගෙදර යවාඇත.

පුෂ්පකුමාර නිවසේදී හොඳටම අසනීප වූ අතර, අල්ලා ගත් සැකකරු නිදහස් කර පුෂ්පකුමාරව නැවත අත්අඩංගුවට ගැනීමට පොලිසිය සුදානම් වන බවත් ඒ නිසා නැවත පුෂ්පකුමාරව රෝහල් ගත කිරීම සුදුසු ඔවුනට දැන ගැනීමට ලැබී ඇත. නමුත් පොලිසියේ බලපෑම මත පුෂ්පකුමාරව පුත්තලම රෝහලට භාර නොගන්නා ලදී. මේ අවස්ථාවේ මානව හිමිකම් සංවිධානයක් පැමිණ පුෂ්පකුමාරව පිට පලාතක රෝහලකට ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත. පසුව ළමා අයිතීන් අධිකාරිය මගින් පුෂ්පකුමාරව කොළඹ රෝහලට මාරු කර යවන ලදී.

**පුෂ්පකුමාරගේ පවුලේ පසුබිම**

14 වියැති පුෂ්පකුමාර මීට වසර 03 කට පෙර ආර්ථික ප්‍රශ්ණ හේතුවෙන් පාසල් අධ්‍යාපනය නවතා දමා ඇත. මවගේ අසනීප තත්වය හේතුවෙන් ඇය කල සුළු වෙළඳාම කඩාකප්පල් වී ඇති බැවින් මව ජීවත් කරවීමට ඔහු ගල් වලක රැකියාව කර ඇත.
පුෂ්පකුමාරගේ නඩුව පැවති දිනයන්

| | | |
|---|---|---|
| 2005 | අප්‍රේල් | 27 |
| 2005 | ජුලි | 12 |
| 2005 | ඔක්තෝබර් | 31 |
| 2006 | මාර්තු | 10 |
| 2006 | ජුලි | 04 |
| 2006 | සැප්තැම්බර් | 26 |
| 2006 | දෙසැම්බර් | 13 |

**පුෂ්පකුමාර සමග පැවැත්වූ සාකච්ඡාවෙන් ගොනු කල තොරතුරු**

- ඔහු දැනට ආරක්ෂාව යටතේ ජීවත් වන අතර රියැදුරු පුහුණුව ලබයි.
- ඔහුට ඔහුගේ ගමට යාමට නොහැකිය. නිරන්තරයෙන් ඔහුට හා ඔහුගේ පවුලට එල්ල වන මරණීය තර්ජන නිසා ඔවුන් බියෙන් පසු වෙයි.
- උසාවි ගිය සමහර අවස්ථා වලදී පුෂ්පකුමාර ඇතුළු පිරිස ගමන්ගත් වාහනය ලුහු බැඳ ඇත.
- පුෂ්පකුමාරට ස්ථිර නිවහනක් දැන් නොමැත. ඔහුට තම මව හා සහෝදරිය සමඟ එකට ජීවත් වීමේ අවස්ථාව අහිමි වී ඇත.

**පුෂ්පකුමාරගේ මව හා සහෝදරිය සමග පැවැත්වූ සාකච්ඡාවෙන් ගොනු කල තොරතුරු**

- ✓ ඔහු දැනට ආරක්ෂාව යටතේ ජීවත් වන අතර දැනට රියදුරු පුහුණුවීම සිදු කරනු ලබයි.
- ✓ ඔහුගේ ගමට ගොස් ජීවත් වීමට හැකියාවක් පුෂ්පකුමාරට නොමැති බවත් ඔහුට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට නිරන්තරයෙන් පොලීසියෙන් එල්ලවන තර්ජන හේතුවෙන් බියෙන් පසු වන බවත්ය. මේ හේතුව නිසා ඔහුට තමන්ගේ මව හා සහෝදරිය හමුවීමට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකිනි.
- ✓ නඩුවට සහභාගී වීමට අධිකරණයට ගිය අවස්ථාවන් වලදී පුෂ්පකුමාර ඇතුළු පිරිස ගමන් ගත් වාහනය ලුහු බැඳ ඇත.
- ✓ රටක නීතිය ආරක්ෂා කරන්නන් විසින්ම නීතිය උල්ලංගනය කරයි නම් මෙවැනි අසාධාරනයට ලක්වූවන්ට පිළිසරණයක් ලබා ගැනීමට යොමු විය යුත්තේ කොතැනකටද යන්න පුෂ්පකුමාරගේ සහෝදරියගේ පළමු ප්‍රශ්නය විය.
- ✓ මුදල් බලයට යටවී පොලීසිය ක්‍රියා කරයි නම් සාමාන්‍ය ජනතාවට කුමක් සිදු වේද යන්න ඔවුන්ගේ දෙවැනි ප්‍රශ්නය විය.
- ✓ ඔවුන්ගේ පවුල ජීවත් වන්නේ ඉතාමත් බියෙන්ය. පුෂ්පකුමාරගේ සහෝදරිය ඒ පිළිබඳව පවසන්නේ මෙසේය. "අපි අදටත් ජීවත් වෙන්න හරිම බයෙන්. මල්ලිට ගමට ඇවිල්ලා ජීවත් වෙන්න බෑ. නිතරම පොලිසියෙන්, මැරයන්ගෙන් තර්ජන එනවා නඩුව ඉල්ලා අස්කරගන්න කියලා. මේ නිසා අපේ පවුලේ සතුට නැතිවෙලා ගිහිං.

නඩුව කල් යන්න කල් යන්න අපිට පීඩනය වැඩියි. වැරදි කරුවන් නිදැල්ලේ. අපිට මල්ලිගෙ ජීවිතටය ගැන පුදුම බයක් තියෙන්නේ. එයා පිරිමි ළමයෙක්, එයාට කියලා අනාගතයක් තියෙන්න ඕනේ, එයා දැනට මානව හිමිකම් ආයතනයක රැකවරණය ලබමින් සිටිනවා. නඩුව ඉක්මනට ඉවර වුනොත් අඩුම තරමේ මල්ලිට නිදහසේ ඉන්න පුළුවන්. අපි දුප්පත් මිනිස්සු නිසාද අපිට මෙහෙම වද දෙන්නේ. නඩුව තියෙන හැම වෙලාවෙම අපි වේදනා විඳිනවා. උසාවියට ගියාම අපි පුදුම විදිහට රස්තියාදු වෙනවා. දවසම එපා වෙනවා. අපි මානසිකව හරියට වැටෙනවා. ඉක්මනින් නඩුව ඉවර වෙනවානම් හොඳයි.'

**[9]සිද්ධි අංක 05**

| | | |
|---|---|---|
| වින්දිතයාගේ නම | :- | ලලිත් රාජපක්ෂ (වයස අවුරුදු 19) |
| ලිපිනය | :- | 328, බටගම උතුර, ජා ඇල. |
| සැකකරුවන් | :- | කදාන නපොලිස්ථානයේ විජේරත්න (Badge nu. 31125) සහ තවත් දෙදෙනකු |
| වධහිංසාවට ලක් වු දිනය | :- | 2002 අප්‍රේල් 19 වන දින |

**සිද්ධිය**

අංක 31125 දරන පොලිස් නිලධාරී විජේරත්න මහතා හා තවත් දෙදෙනෙකු ලලිත්ව 2002 අප්‍රේල් 19 වන දින හොරකමක් සම්බන්ධව සැකපිට අත්අඩංගුවට ගෙන කදාන පොලීසියට ගෙන යන ලදී. මෙහිදී මූලික කරුණ වන්නේ සොරකම සිදු කළ බවට සැක කරන ලලිත් නැමැති පුද්ගලයා වෙනුවට මෙම සිදුවීමට ගොදුරුවූ ලලිත් රාජපක්‍ෂව අත් අඩංගුවට ගැනීමයි.

අප්‍රේල් 19 වන දින අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ලලිත් ඔහුගේ මිතුරකුගේ නිවසේ නිදාගෙන සිට ඇත. පොලීසිය විසින් ඔහුව වදහිංසනයට ලක් කරමින් පොලිස් ස්ථානයට ගෙන ගොස් ඇත. පසු දින උදෑසන එනම් 20 වන දින ඔහුගේ සීයා ලලිත් බැලීමට කදාන පොලීසියට යන අවස්ථාවේදී ඔහු සිර කුඩුවක් තුල බිම දිගාවී සිටින සිටින අයුරු දැක ඇත. ලලිත් මැරී ඇතැයි බියෙන් "මුන් මගේ ළමයාව මරලා" යනුවෙන් කෑගසා ඇත. සීයාගේ මෙම විලාපය ඇසූ පොලිස් නිලධාරීන් පැමිණ ලලිත්ව සිර මැදිරියෙන් එළියට ඔහුට ෆිට් එක (Fit) සෑදී ඇති බව පවසා ඔහුගේ තත්වය බරපතල බැවින් වහාම ලලිත්ව රාගම මධ්‍යම රෝහලට ගෙන යන ලදී. මැයි මස 07 වන දින දක්වා ලලිත් සිහිසුන්ව සිටින ලදී. (ඔහුගේ තත්වය පළිබඳ අදාල වාර්ථාවේ සඳහන් වේ. ඇමුණුම් 1.5 යටතේ දක්වා ඇත)

---

[9] AHRC,:"urgent appeal", "http://www.ahrchk.net/ua/mainfile.php/2002/240/" , 'http://www.ahrchk.net/ua/mainfile.php/2002/253/ '

**ලලිත්ගේ වර්තමාන තත්වය**

ඔහුගේ තත්වය 100% සුව නොවුවත් යම්තක් දුරට යහපත් තත්වයක පසුවේ. වෛද්‍ය ප්‍රතිකාර හා උපදේශනය මඟින් ඔහුගේ මානසික මට්ටම යහපත් තත්වයකට ගෙන ඇති අතර දැනට ඔහු රැකියාවකද නිරත වේ. නමුත් එකම කාර්ය නොකඩවා කරගෙන යමට සුදුසු මානසිකත්වයක් ඔහුට නොමැත. වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ හා මීගමුව මහාධිකරණයේ නඩු 02 ක් ඇත. දැනට එම නඩු විභාග කරමින් හා සාක්ෂි විමසමින් පවතී. මෙම සිදුවීම සිදුවූ වසර 05 කට ආසන්න වුවත් තවම නඩු අවසන් වී නොමැත.

**ලලිත් සමඟ පැවැත්වූ සාකච්ඡාවෙන් ගොනු කළ තොරතුරු.**

- ✓ ඔහුගේ වර්තමාන සෞඛ්‍ය තත්වය පිළිබඳව ඔහු සෑහීමකට පත්වේ.
- ✓ ඔහුට විවාහ දිවියකට ඇතුලු වීමට අවශ්‍ය වුවත් ඔහුගේ තත්වය දැනගත් පසු කිසිවකු විවාහ වීමට අකමැති බව පවසන ලදී. ( ඔහු ගැහැණු ළමුන් 03 කු සමඟ ආදර සබඳතා ගොඩනගාගෙන තිබී ඇති අතර ඔහුගේ මෙම තත්වය දැන ගත් පසු ඔවුන්ගේ දෙමාපියන් ලලිත්ව ප්‍රතික්ෂේප කර ඇත)
- ✓ ඔහු ස්ථිර රැකියාවක් සොයමින් සිටී.
- ✓ නඩුව අවසාන නොවීම හේතුවෙන් නිවසට යාමට හැකියාවක් නොමැත. ජීවිතයට හානියක් වේයැයි බියෙන් පසුවෙයි.
- ✓ ඔහුගේ ගමන් බිමන් සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බවත් නඩුව ඉක්මනින් නිමාවී ඔහුට ගමට යාමට ලැබේ නම් එය ඉතා හොඳ බවත් පවසන ලදී. මේ හේතුවෙන් ඔහු නිවසින් පිට පළාතක ආරක්ෂාව යටතේ ජීවත් වේ.

**අදාල මානව හිමිකම් ආයතන වල අධ්‍යක්ෂවරුන් සමඟ පැවැත්වූ සාකච්ඡා වලින් ගොනු කළ කරුණු. (අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම මත නාමයන් ඉදිරිපත් කර නොමැත)**

පවතින නඩු වල ප්‍රමාදය නිසා සිදුවී ඇති හානි පළිබඳ ඔවුන්ගේ අදහස් මෙසේය.

- ➢ නිරන්තරයෙන්ම නඩු කල්යාම හේතුවෙන් වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් මානසිකව පීඩනයට ලක් වේ. මෙම හේතුව තම නඩු අතහැර දැම්මට ඔවුන් පෙළඹී ඇත. තවද ප්‍රමාදය හේතුවෙන් විත්තිකරුවන්ගේ තර්ජනවලට නිරන්තරයෙන් ඔවුන් මුහුණ දෙති.
- ➢ නඩු ඉල්ලා අස්කරගන්නා ලෙස විවිධ පාර්ශව විසින් බලපෑම් එල්ලකරයි.
- ➢ වින්දිතයන්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් හා සාක්ෂි කරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න මතුවී ඇත. බොහෝ වින්දිතයන්ට තමන්ගේ නිවසේ රැඳී නමන්ගේ සුපුරුදු ජීවන රටාවේ නිරත වීමේ හැකියාවක් නොමැත. එබැවින් මොවුන්ට ආරක්ෂාව සොයා වෙනත් ස්ථාන වලට යෑමට සිදු වී ඇත. ඔවුන්ට අවශ්‍ය ආරක්ෂා සැපයීම රජයේ වගකීමකි.

- දිගින් දිගටම නඩු කල්යාම නිසා සාක්ෂිකරුවන්ට එම සියළු සිද්ධියම මතකයේ තබා ගැනීමේ හැකියාව නොමැති බැවින් මෙය පසු සාක්ෂි විමසීමේදී ඔවුන්ට අවාසිදායක විය හැක.

- එමෙන්ම මෙවැනි සිදුවීම් වලට ගොදුරු වූවන්ගේ කාලයත් මුදලත් විනාශ වී යයි.

- මෙසේ දිගින් දිගටම නඩු ප්‍රමාද වීම නිසා රටක් තුල සිදු වන අපරාධ දිනෙන් දින ඉහලයාමේ ප්‍රවනතාවයක් පවතී. එමෙන්ම රටේ සාමාන්‍ය ජනතාවට නීතිය ඉදිරියේ සම තැන් නොලැබීම හේතුවෙන් ජනතාව තුල යුක්තිය සොයා යෑමේ උනන්දුව නැති වී ඇත.

- පවතින නඩු ප්‍රමාදය අවම කිරීමට යාන්ත්‍රනයක් ක්‍රියාත්මක විය යුතුය. විශේෂයෙන් අසාධාරණයට ලක්වූ ළමුන්ගේ නඩු ප්‍රමාදය ඉතා කණගාටුදායකය. ළමා ප්‍රඥප්තිවට අත්සන් කර ඇති අප රටේ බහුල ලෙස ළමා අයිතින් කඩ වෙමින් පවතී.

**නීතීඥවරුන් සඳහා ඉදිරිපත් කළ පශ්ණාවලිය.**

මෙම ප්‍රශ්ණාවලිය නීතීඥ වරුන් 15 දෙනෙකු අතර බෙදා දුන් අතර, එහිදී ගොනු කළ කරුණු පහත පරිදි සාරාංශ කර ඇත.


**ප්‍රශ්න අංක 01**

නඩු ප්‍රමාදයක් පවතින බව 100 % ක් නීතීඥවරුන් පිළිගන්නා ලදී.

**ප්‍රශ්න අංක 02**

නඩු ප්‍රමාද වීම මඟින් පීඩනයට ලක් වූවන්ගේ ප්‍රතිශතය පහත පරිදි ඉදිරිපත් විය.

| | | |
|---|---|---|
| නඩුකාරවරුන් | - | 0 |
| නීතීඥවරුන් | - | 01 |
| පොලිස් නිලධාරීන් | - | 01 |
| වදහිංසනයට ලක්වූ වින්දිතයන් - | | 13 |




**ප්‍රශ්න අංක 03**

නඩු ඇසීම සඳහා දැනට පවතින පහසුකම් පිළිබඳ නීතීඥවරුන්ගේ අදහස් මෙමගින් දැන ගැනීමට උත්සහ කරන ලදී.

මෙහිදී පවතින යටිතල පහසුකම් පිළිබඳ 100% පිරිස සෑහීමකට පත් විය නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

**ප්‍රශ්න අංක 04**

වර්ථමාන විනිසුරුවන් ප්‍රමාණය ගොඩනැගී ඇති නඩු අවසන් කිරීමට ප්‍රමානවත් වේද යන්න පිළිබඳව සොයා බැලීමට මෙම ප්‍රශ්නය ගොනු කරන ලදී.

වර්ථමාන විනිසුරුවන් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව 100% පිළිගැනීම විය.

**ප්‍රශ්න අංක 05**

අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ ශාඛාවන් කොළඹින් පිට පිහිටුවීම යම්තාක් දුරට හෝ නඩු ප්‍රමාදය වලක්වාලීමට පිටුවහලක් වේද යන්න සොයා බැලීමට මෙම ප්‍රශ්නය ගොනු කරන ලදී.


මෙහිදී 100% කගේ අදහස වූයේ අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ ශාඛාවන් කොළඹින් පිට පිහිටුවීම යම්තාක් දුරට හෝ නඩු ප්‍රමාදය වලක්වාලීමට පිටුවහලක් වන බවයි.

**ප්‍රශ්න අංක 06**

මෙම ප්‍රශ්නය මගින් සාමාන්‍ය ජනතාවගේ නීතිය පිළිබඳ තිබෙන දැනුවත් බව පිළිබඳව අවධානය යොමු කරන ලදී.


මෙහිදී ලබා ගත් තොරතුරු මෙසේය.

1. ප්‍රමාණවත්
2. ප්‍රමාණවත් නොවේ




**ප්‍රශ්න අංක 07**

මෙම ප්‍රශ්නය මූලික වශයෙන් වින්දිතයන් ඔවුන්ගේ ඥාතීන් හා සාක්ෂිකරුවන් මුල් කරගෙන විමසන ලදී. නඩු ප්‍රමාදයේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් නිරන්තර තර්ජන හා බිය වැද්දීම් වලට ලක්වන්නේද යන්න සොයා බැලීම මෙහි මූලික අරමුණ විය.




**ප්‍රශ්න අංක 08**

මෙම ප්‍රශ්නය මූලික වශයෙන් වින්දිතයන් ළමා වින්දිතයන් මුල් කරගෙන අසන ලදී.
දීර්ඝ නඩු තුලින් ළමා වින්දිතයන්ගේ අයිතීන් කඩවන බව 100% දෙනා පිළිගන්නා ලදී.

**ප්‍රශ්න අංක 09**

නඩු කල්යාම කෙරෙහි පොලිස් නිලධාරීන්ගේ විමර්ශන කටයුතු වල අකාර්යක්ෂමතාවය තරමක් දුරට හෝ දුරට බලපා ඇතිද යන්න සොයා බැලීම මෙමගින් සිදු කෙරේ.




**ප්‍රශ්න අංක 10**

වර්තමානයේ බහුල ලෙස දූෂණ නඩු ඉල්ලා අස්කර ගන්නා බවට වාර්තා වී ඇත. මෙම ප්‍රශ්නය මගින් මෙයට හේතු සෙවීමට උත්සහ කරන ලදී.

| | |
|---|---|
| නඩු කල්යාම හේතුවෙන් අධිකරණය කෙරෙහි පැවති විශ්වාසය බිඳීම හා කල කිරීම | - 09 |
| විත්තිකරුවන් විසින් නඩු ඉල්ලා අස් කර ගැනීමට බලපෑම් කිරීම | - 04 |
| පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකලාප | - 02 |

**ප්‍රශ්න අංක 11**

මූලික වශයෙන් මෙම ප්‍රශ්නය මගින් නඩු ප්‍රමාද වීමට හේතු සෙයා බැලීමට අදහස් කල අතර මෙහිදී ඉදිරිපත් වු කරුණු පහත පරිදි ගොනු කර ඇත.

I. පොලිසිය විසින් කඩිනම් විමර්ශන කටයුතු සිදු නොකිරීම.

II. පවතින යටිතල පහසුකම් වල ඌනතාව.
III. විනිසුරුවරුන් ප්‍රමානවත් නොවන බව.
IV. අධිකරණයේ ක්‍රියා පටිපාටිය බොහෝ අවස්ථාවලදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීම.
V. අපරාධ නඩු එකවර මුල සිට අගට අසා අවසන් කිරීමේ සම්ප්‍රදායක් නොමැති වීම.
VI. නීතීඥයින් කල් ඉල්ලීම.
VII. දැනට නඩු විභාග කිරීම සඳහා පවත්නා ප්‍රාදේශීය ස්ථාපිත අධිකරණ ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පවතී.
VIII. එක් දිනයකදී ඇසිය යුතු නඩු ප්‍රමානය ඉතා විශාල වීම.

**ප්‍රශ්න අංක 12**

මෙහිදී නඩු ප්‍රමාදය හේතුවෙන් කඩවන ළමා වින්දිතයන්ගේ අයිතීන් පිළිබඳ සොයා බැලීමට අදහස් කරන ලදී. මෙහිදී ඉදිරිපත් වූ කරුණු අනුව,

I. දීර්ඝ කාලීන සාක්ෂි ගැනීම තුල ළමුන්ට නඩුවලට අදාල කරුණු අමතක වීම.
II. ඔවුන්ගේ ළමා අවධිය ඔවුන්ට අහිමි වීම.
III. ළමා මනස නිරන්තරයෙන් පීඩනයට ලක්වීම.
IV. ළමුන්ගේ අධ්‍යාපනයට බාධා ඇති වීම.
V. බොහෝවිට ළමුන්ට තම පවුල් වලින් ඈත්ව සිටීමට සිදු වීම.
VI. අපරාධකරුවන් බොහෝවිට ඇප ලබා නිදහස් වී සාමාන්‍ය ජනතාව අතරට පැමිණීමේ ප්‍රවනතාවය වැඩි වීම හේතුවෙන් අපරාධ කරුවන් හට නැවත නැවත අපරාධ කිරීමට ඇති අවස්ථාවන් වැඩි වීම.
VII. විශේෂයෙන් මැර තර්ජන වලට වින්දිතයින්, නෑයින් හා සාක්ෂිකරුවන් නිරන්තර ගොදුරුවීම හා එම හේතුවෙන් මානසික නිදහසද නැති වීම.
VIII. දීර්ඝකාලීනව අම්හිරි සිද්ධීන් මතකයන්ට ගැනිමට සිදුවීම හේතුවෙන් සමාජය පිළිබද හා නීතිය පිළිබද කලකිරීම.
IX. පොලිස් නිළධාරීන් අපරාධකරුවන් හා සම්බන්ධවීමට ඇති ප්‍රවනතාව වැඩිවීම.(බොහෝවිට මුදල් බලයට පොලිස් නිළධාරීන් වැඩ කිරීම)
X. විශේෂයෙන් නඩු ප්‍රමාදය ළමා වින්දිතයින්ගේ අනාගතය කෙරෙහි බලපා ඇති බව.

## පස්වන පරිච්ඡේදය

## දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම

ශ්‍රී ලංකාවද ජාත්‍යන්තර ළමා ප්‍රඥප්තියට අත්සන් කර ඇති අතර, එහි සඳහන් සියලුම කරුණු ආරක්ෂා කර ගැනීමට රජය බැඳී සිටී. වයස අවුරුදු 18 ට අඩු සියලු දෙනා ළමුන් ගණයට අයත් වේ. ළමයා යනු විශේෂ සැලකිල්ලට ලක් කළ යුතු සියළු දෙනාගේම ආදරය හා ආරක්ෂාව යටතේ ජීවත් විය යුතු වස්තුවකි. රටක හෝ සමාජයක අනාගතය රැඳී තිබෙන්නේ එම රටේ සමනලුන් වැනි ළමා පරපුර මතයි. මෙහි සඳහන් සිද්ධි අධ්‍යයන 5ට අදාලව අවාසනාවන්ත ඉරනමට ගොදුරු වී ඇත්තේ අසරණ දුප්පත් ළමුන්ය . මෙහි පළමු සිද්ධි අධ්‍යයන තුනේම වින්දිතයින් කාමාතුරයින්ගේ දූෂණයට ලක්වී ඇත. ඉතාමත් කනගාටුදායක කරුණ වන්නේ , පියවරුන් අතින් තම ලෙයින් උපන් දැරියන් විනාශවීමය.

මෙහිදී යුක්තිය පසඳලීමේ පමාව රටේ සෑම සංස්ථාවක් කෙරෙහිම බලපා ඇති බව මනාව පැහැදිලිවන කරුණකි. පමාව හේතුවෙන් රජයේ සියලු සංස්ථා මෙන්ම පුද්ගලික ව්‍යාපාර තුළද ව්‍යාකූලතාවක් වර්ධනය වේ. විශේෂයෙන් මෙම හේතුව නිසා වින්දිතයින් හා වින්දිතයින්ගේ පවුල් සමාජිකයින්ගේ මූලික අයිතීන් ප්‍රධාන වශයෙන් කඩවීමට ලක් වී ඇත.

ඉහත දූෂණයට ලක්වූ දැරියන් තිදෙනා හා වධහිංසාවට ලක්වූ දරුවන් හා ඔවුන්ගේ පවුල් සාමාජිකාවන් සමග පැවැත්වූ සාකච්ඡාවේ ගොනු කළ කරුණු අනුව නඩු පමාව හේතුවෙන් පහත සඳහන් ඔවුන්ගේ මූලික අයිතීන් උල්ලංඝනය වී ඇත.

(a) ජාත්‍යාන්තර ළමා ප්‍රඥප්තියට අනුව සෑම ළමයෙකුම දෙමාපිය රැකවරණය යටතේ පිවත්වීමට අයිතියක් ඇත. නමුත් දීර්ඝ නඩු පමාව හේතුවෙන් තම දෙමාපියන් සමග එකට ජීවත්වීමේ අයිතිය අහිමි වී ඇත.

(b) සෑම ළමයෙකුටම අධ්‍යාපනය සඳහා අයිතියක් ඇත. නමුත් අධ්‍යාපනය සඳහා වෙන්ව ඇති කාලය තුළ දීර්ඝ වශයෙන් පොලිස් විමර්ශණ හා අධිකරන විමර්ශණ සඳහා ළමුන් දිගින් දිගටම කැඳවීම හේතුවෙන් අධ්‍යාපනය සඳහා යොමුවිය යුතු කාලය අඩුවී ඇත. (මෙහි සඳහන් සියලුම වින්දිතයින් යම් මානව හිමිකම් ආයතන වල රැකවරණය යටතේ අධ්‍යාපනය ලබන අතර, සම්පූර්ණ ලෙස තම අධ්‍යාපන අයිතිය කඩවූ ළමුන් සිටින බව ප්‍රධාන වශයෙන් සැලකිය යුතුය.)

(c) සෑම ළමයෙකුටම වැඩිහිටියන්ට මෙන් ගෞරුත්වයක් ඇතිව සමාජයේ ජීවත්වීමට පූර්ණ අයිතියක් ඇත. නමුත් අසරණ වින්දිතියින්ගේ ගරුත්වය උසාවිය තුලදීම විනාශ වී ඇත. දිගින් දිගටම අධිකරණ ක්‍රියාවලිය තුළට හා මාධ්‍ය තුළට විවෘත වීම හේතුවෙන් එය ඔවුන්ගේ ඉදිරි අනාගතයට බාධා පැමිණ ඇත.

(d) සෑම ළමයෙකුටම තම පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමට අයිතියක් ඇත. නමුත් පවතින අධිකරණ ක්‍රියාවලිය තුළ ළමුන්ගේ පෞද්ගලීකත්වය හානි සිදුවී ඇත.

(e) ළමයාගේ වර්ධනය, යහපත හා රැකවරණය කෙරෙහි සෑම දෙමාපියකුටම මූලික වගකීමක් ඇත. නමුත් මේ අයිතිය පියවරුන් විසින්ම උල්ලංඝනය කර ඇත.

(f) ළමා අයිතිවාසිකම් පිළිබද ප්‍රඥප්තියේ 37 වන වගන්තියට අනුව කිසිම ළමයෙකු වධහිංසාවට පැමිණවීම,අත්අංඩංගුවට ගැනීම හා සිරගත කිරීම නොකළ යුතුව. නුමත් ඉහත iv හා v සිද්ධි දෙකේදීම ඉහත කරුණු ඉතා දරුණු ලෙස උල්ලංඝනය කර ඇත. ළමුනට රැකවරණය දීම වෙනුවට ඔවුන්ගේ ගරුත්වයට,අනන්‍යතාවයට, ඇති අයිතිය මූලික වශයෙන් උල්ලංඝනය වී ඇත. ඉතා දරුණු වධවේදනාවලට ලක්වී ඇති ළමුන්ගේ නිදහස් චින්තනයට ඇති අයිතිය සම්පූර්ණ ලෙස උල්ලංඝනය වී ඇත. විශේෂයෙන් නඩු ප්‍රමාද වන අධිකරණ ක්‍රියාවලිය තුල නිරන්තරයෙන් තමනට අපරාධ සිදුකළ අපරාධකරුවන් හා පොලිස් නියෝජියින් වෙත ඉදිරිපත් කිරීමෙන් ඔවුන් යලි යලිත් මානසික පීඩනයට පත්වේ.

(g) අධිකරණ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් අපරාධකරුවන්ගේ නිරන්තර තර්ජනයන්ට වින්දිතයින් , ඔවුන්ගේ ඥාතීන් හා සාක්ෂිකරුවන් ගොදුරු වීම හේතුවෙන ඔවුන්ගේ ආරක්ෂාවට තර්ජන එල්ලවී ඇත.

(h) සෑම පුරවැසියකුටම තමා කැමති පුද්ගලයෙකු සමග විවාහ වීමට අයිතියක් ඇත. නමුත් ඉහත සදහන් සියලු වින්දිතයින්ගේ එම අයිතිය උල්ලංඝනය වී ඇති අතර, නඩු ප්‍රමාද වීම හේතුවෙන් අනාගතය පිළිබද නිවැරදි තීරණ ගැනීමට ඔවුනට හැකියාවක් ලැබී නැත. මේ හේතුව නිසා බොහෝ වින්දිතයින් නඩු ඉල්ලා අස්කර ගැනීමට පෙළඹී ඇත. මෙම තත්වය යහපත් සමාජයක් ගොඩනැගීම කෙරෙහි බලපානු ලැබේ.

**නීතීඥවරුන් සදහා ඉදිරිපත් කළ ප්‍රශ්ණාවලිය.**

ප්‍රශ්න අංක 01 මගින් තහවුරු වුයේ සත්‍ය වශයෙන්ම රටේ නඩු ඇසීමේ ප්‍රමාදයක් ඇති බවයි. ඉදිරිපත් වූ කරුණු අනුව 100% පිළිගැනීම වුයේ නඩු ඇසීම පිළිබදව ඉතා දීර්ඝ කාලයක් ගතවන බැවින් , එය යුක්තිය පසදලීමට විශාල බාධාවක් වන්නේය.

නිරන්තර නඩු ප්‍රමාදය හේතුවෙන් දූෂණයට හා වධහිංසනයට ලක්වූ වින්දිතයින් 86% පීඩාවට ලක්වේ. නීතීඥවරුන් හා පොලිස් නිළධාරීන් 7 % පමණ ප්‍රමාණයක් පීඩාවට ලක්වේ. මෙයින් මනාව පැහැදිලි වන්නේ නඩු ප්‍රමාදය හේතුවෙන් වින්දිතයින් වැඩි වශයෙන් පීඩනයට පත් වන බවයි.

යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමද නඩු ප්‍රමාද වීමට මූලික හේතුවක් බව 100% ගේ පිළිගැනීම වේ. පැරණි සම්ප්‍රදායික ක්‍රම භාවිතා කිරීම (උදාහරන ලෙස තවමත් යතුරුලියනය භාවිතය) මෙයට මූලික හේතුව වේ. තවද ලඝු ලේඛිකාවන්ගේ හිඟකම, ගබඩා පහසුකම් මද කමද මෙයට හේතු වී ඇත.

දිනකට ඇසිය යුතු නඩු ප්‍රමාණය ඉතා විශාල වන අතර,එක් විනිසුරුවරයෙකුට එක් නඩුවකට දින දිය හැකි කාලය ඉතා කෙටිය. මේ නිසා බොහෝ අවස්ථාවලදී නඩු දින දී කල් යනු දක්නට ලැබේ. තවද, නඩු මස දෙක තුන කල් යවනු ලැබේ. සියලුම නීතීඥවරුන්ගේ ඒකමතික තීරණය වුයේ විනිසුරුවන්ගේ හිඟකමක් පවතින බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය කොළඹට පමණක් සීමා කර තිබීම හේතුවෙන් රටේ සියලුම පුරවැසියනට තම මූලික අයිතිවාසිකම් නඩු සඳහා විශාල වියදමක් ,කාලයක් වැයකරගෙන කොළඹට යාමට සිදු වී ඇත. මේ නිසා ඉතා දුර ප්‍රදේශවල සිවිල් ජනයාට එක් දිනක් උසාවි එම සඳහා දින තුනක් පමණ ගත කිරීමට සිදු වී ඇත. මෙමගින් මූලික වශයෙන්ම ඔවුන්ගේ රැකිරක්ෂා සඳහා ඇති කාලය අපතේ යාමක් සිදු වන අතර, අධික වියදමක් දැරීමටද සිදු වන බැවින් එය ඔවුන්ගේ ආර්ථිකයට සෘජු ලෙස බලපායි. මේ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ ශාඛාවල් කොළඹින් පිට පිහිටුවීම තුළින් සිවිල් වැසියන්ගේ අයිතීන් කඩවීම යම්තාක් දුරට හෝ විසදෙන අතර, නඩු බෙදී යාම තුලින් ගොඩගැසී ඇති නඩු කඩිනමින් අවසන් කිරීමට හැකියාවක් ලැබෙනු ඇත.

ප්‍රශ්ණ අංක 6 මගින් සාමාන්‍ය ජනතාවගේ නීතිය පිළිබඳව හා අධිකරණ ක්‍රියාවලිය පිළිබද තිබෙන දැනුවත්කම අවධානයට ලක් කරන ලදි. මෙහිදී (86.6%)ගේ මතය වුයේ සිවිල් ජනයාගේ දැනුම ප්‍රමාණවත් නොවන බවයි. මේ හේතුවෙන් විශාල ලෙස අපරාධ වාර්ථා නොවන අතර විශේෂයෙන් සාමාන්‍ය සිවිල් ජනයා පීඩනයට පත්වේ. මෙයින් විශාල ලෙස වාසි ලබන්නේ ධනයෙන් හා සමාජ තත්වයෙන් උසස් උදවියයි. තවද මේ නිසා රාජ්‍ය ආයතන නීතිය ක්‍රියාත්මක නොකර , ඔවුන්ගේ පෞද්ගලික වාසිය පතා ක්‍රියා කිරීමට ඔවුන් පෙලඹී ඇත. එම නිසා සාමාන්‍ය සිවිල් ජනයාගේ නීතිය හා අධිකරණ ක්‍රියාවලිය පිළිබද දැනුම වර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් රාජ්‍ය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සුදුසුය.

86.6% අදහස වුයේ නඩු ප්‍රමාදය හේතුවෙන් වින්දිතයින් නිරන්තර තර්ජන වලට හා බියවැද්දීම් වලට ලක් වන බවයි. යුක්තිය පසිඳලීම සිදු කළ හැක්කේ සාක්ෂිකරුවන් නිර්භීතව නඩු වල සාක්ෂි දීමට ඉදිරිපත් වුවහොත් පමණි. මෙය සියලුම නඩු කෙරෙහි බලපානු ලැබේ. රට පුරාම සාක්ෂිකරුවන් අතර විශාල භීතියක් පවතී. නිරන්තර නඩු පමාව නිසා සාක්ෂිකරුවන්ගේ දිරිබිඳී නඩු අතහැර දැමීමට ඔවුන් පියවර ගනී. එහිදී දිරි බිදුනු සාක්ෂිකරුවෝ විත්තිකරුවන්ගේ තර්ජණ ඉදිරියේ පසුබායි. තවද සමහරු උසාවියට පැමිණ ඔවුන් මුලින් පොලීසියට ලබා දුන් සාක්ෂියට පටහැනිව බොරු සාක්ෂි ලබා දේ. නඩු පමාව පවතින කාළය තුළ අපරාධකරුවන්ගේ තර්ජන වලට බියෙන් හෝ ඔවුන්ගෙන් මුදල් ලබාගෙන මෙලෙස බොරු සාක්ෂි ලබා දීමට ඉඩප්‍රස්ථාව වැඩි වී ඇත. මේ සියල්ලේ ප්‍රතිපලය වන්නේ සාක්ෂි නැතිකමින් අපරාධරුවන් නිදහස් කිරීමට සිදු වීමයි.

දීර්ඝ නඩු ඇසීම තුළින් ළමා වින්දිතයින්ගේ අයිතීන් කඩවන බව 100% ගේ අදහස විය. 1989 වසරේ සම්මත කරන ලද 1991 වසරේ ශ්‍රී ලංකා රජයේ අත්සන් කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබද ප්‍රඥප්තියට අනුව නඩු ප්‍රමාදය නිසා ළමා වින්දිතයින්ගේ පහත සදහන් අයිතීන් උල්ලංඝනය වන බව මනාව පැහැදිලි වේ.

- දෙමාපිය රැකවරණය ලැබීමට ඇති අයිතිය
- අධ්‍යාපණයට ඇති අයිතිය
- පවුලක් ලෙස එකට ජීවත්වීමේ අයිතිය
- ළමුන්ගේ මතය ඉදිරිපත් කිරිමට ඇති අයිතිය
- නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
- සමාගමේ නිදහසට ඇති අයිතිය
- පුද්ගලිකත්වය රැක ගැනීමේ අයිතිය

නඩු තීන්දු දීම දීර්ඝ ලෙස ප්‍රමාද වීමෙන් ඉහත  සදහන් සියලුම අයතීන් ළමා වින්දිතයින්ගේ කඩ වන අතර, ඔවුන්ගේ වයසේ වර්ධනයත් සමග  අවුරුදු 18 පසු වැඩිහිටියන් ලෙස ඔවුන්ට ලැබිය යුතු අයිතීන්ද අහිමිවේ .

- පුරවැසියකු ලෙස නිදහසේ ජීවත් වීමේ අයිතිය
- නීතිය ඉදිරියේ සමානාත්මතාවය ලැබීමට ඇති අයිතිය
- තමන්ට කැමති රැකියාවක් කිරීමේ අයිතිය
- ශ්‍රී ලංකාව තුළ තමන් කැමති ස්ථානයකට යාම් ඒම් කිරීමේ නිදහස
- සමාජයේ සම තැන ලැබීමේ අයිතිය
- විවාහවීමට ඇති අයිතිය
- ගරුත්වයෙන් යුතුව සමාජයේ ජීවත්වීමට ඇති අයිතිය

ප්‍රශ්ණ අංක 9 මගින් නඩු ප්‍රමාද වීම කෙරෙහි පොලිස් නිළධාරීන්ගේ විමර්ශණ කටයුතු කොතෙක් දුරට බලපා ඇත්තේද යන්න සලකා බලන ලදි. මෙහිදී ඉදිරිපත්වූ කරුණු අනුව 74% අදහස වුයේ නඩු ප්‍රමාද වීම කෙරෙහි යම්තාක් දුරට හෝ පොලිස් නිළධාරීන්ගේ ආකාර්යක්‍ෂම කටයුතු බලපා ඇති බවයි. තවද පොලීසිය හා අපරාධකරුවන් අතර සම්බන්ධතාවයත් යම් තාක් දුරට නඩු ප්‍රමාදය කෙරෙහි බලපා ඇත. වින්දිතයින් සමග කළ සාකාච්ජාවේදී එය මනාව පැහැදිලි විය. බලවතුන්ගේ හෝ පෝසතුන්ගේ හෝ අතකොළු බවට පොලීසිය පත්වී ඇති නිසා හා අල්ලස් ගැනීමට පොලිස් නිළධාරීන් කටයුතු කිරීම මෙයට මූලික හේතු වී ඇත.

නඩු කල්යාම හේතුවෙන් අධිකරණය කෙරෙහි පැවති විශ්වාසය බිඳීම හා කලකිරීම නිසා බොහෝ නඩු ඉවත් කර ගැනීමට මූලික හේතුවී ඇති බව 87% ගේ අදහස වූ අතර, නීතීඥවරුන් නඩු ඉල්ලා අස්කරගැනීමට බලපෑම් කිරීම හා පොලිස් නිළධාරීන්ගේ ක්‍රියාකලාපයන්ද මේ සඳහා බලපා ඇති බව ප්‍රකාශ කර ඇත. නමුත් පළමු කාරණය ඉතා ප්‍රබල බව ඉදිරිපත් විය. මෙසේ කළකිරීමට හා විශ්වාසය බිඳීයාමට හේතු වී ඇත්තේ නිරන්තර තර්ජන හා බිය වැද්දීම් වලට වින්දිතයින් හා සාක්ෂිකරුවන් ගොදුරුවීමත්, රස්තියාදුව ,ආර්ථික අපහසුතා, විශාල වශයෙන් මුදල් වියදම් කිරීමට සිදුවීම හා නීතීඥවරුන් ගේ ක්‍රියාකලාපය කෙරෙහි විශ්වාසය බිඳී යාමයි. මෙහිදී නීතීඥ මහතෙක් ප්‍රකාශ කලේ (නම සඳහන් නොකරන ලෙස ඉල්ලන ලදි.) දෙපැත්ත කන නීතීඥවරුන් සිටින තාක් කල් යුක්තිය හා සාධාරනත්වය නිසියාකාරව ඉෂ්ඨ කළ නොහැකි බවයි.

ප්‍රශ්ණ අංක 11 මගින් සෘජුවම නඩු ප්‍රමාදවීම කෙරෙහි නීතීඥවරුන්ගේ අදහස් ලබා ගත්හ. මෙහිදී ගොනු වූ කරුණු අනුව අධිකරණ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව මූලික වී ඇති බව මනාව පැහැදිලි වේ. නඩු ඇසීමේ ශාලා හා විනිසුරුවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී මේවා සැපයීම රජයේ මූලික වගකීම වේ. මෙයට යටිතල පහසුකම් පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය වගකිව යුතු වන්නේය. විශේෂයෙන් අධිකරණ කටයුතු ඉංග්‍රීසි භාෂවෙන් පැවතීමද නඩු ප්‍රමාද වීමට හේතුවී ඇති බව මනාව පැහැදිලිවේ.

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍ය භාෂාව වන සිංහල හා දෙමල භාෂා සමස්ථ ශ්‍රී ලංකාව මුලුල්ලේම පරිපාලන භාෂාව විය යුතු බව පිළිගෙන ඇත. තවද 4 වන පරිච්ඡේදයේ 24 (1) අනුව ශ්‍රී ලංකාව මුලුල්ලේම අධිකරණයේ කටයුතු රජ්‍ය භාෂාවෙන් කළ යුතු බවත් ,අධිකරණයේ වාර්ථා සහ නඩු කටයුතු රාජ්‍ය භාෂාවෙන් විය යුතු බවත් සඳහන් කර ඇත. නමුත් ප්‍රායෝගිකව මෙය සිදු නොවේ. සාමාන්‍ය ජනතාවගේ භාෂා සිංහල හෝ දෙමල වේ. මෙසේ ජාත්‍යාන්තර භාෂාවෙන් නඩු ඇසීම මගින් ඔවුන්ගේ මූලික අයිතීන් සියල්ල කඩවේ. මන්ද උසාවි තුළ සිදු වන දෑ පිළිබඳ කිසිම අදහසක් තේරුම් ගැනීමට ඔවුන්ට නොහැකිවීම තුළින් ඔවුනට සාධාරනත්වයක් ඉෂ්ඨ වේද යන්න පිළිබඳව සැක සහිත වීම නිසාය.

ප්‍රශ්ණ අංක 12 යටතේ ගොනුවූ කරුණු අනුව නඩු ප්‍රමාද වීමෙන් වින්දිතයින්ගේ මූලික අයිතීන් කඩ වන බව මනාව පැහැදිලි වේ.

ප්‍රශ්ණ අංක 13 යටතේ නඩු ප්‍රමාදය වැලැක්වීම සඳහා ගත යුතු ක්‍රියා කලාපයන් පිළිබඳව ඉදිරිපත් වූ කරුණු අනුව

- සමස්ත අධිකරණ ක්‍රියාවලියම පරිගණක ගත කළ යුතු බව
- අපරාධ නඩු මුලසිට අගට අසා අවසන් කිරීමේ සම්ප්‍රදායක් ඇති කිරීම (විනිසුරු අබේපිටිය මහතාගේ නඩුව වැනි නඩු හැර අනිත් නඩු මදක් අසා කල් තැබීම නිසා බොහෝ කාලයක් දිග් ගැස්සී ඇත)
- සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ විශේෂ පණතක් ගෙන ඒමත් එම පනත නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමත්

- බොහෝ නඩු ප්‍රමාදවීම හා දූෂණය වැඩිවීම කෙරෙහි පොලිස් දෙපාර්ථමේන්තුවේ නිළධාරීන් දැනුවත් නොවීම බලපා ඇත. එම නිසා පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට අධිකරණ කටයුතු කෙරෙහි පරිචය ලබා දීමට ක්‍රියා කළ යුතුය.
- අවසාන වශයෙන් රටපුරාම ස්ථාවරත්වය ඇති කිරීම සඳහා 2001 සිදු කළ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය මගින් ඇති කළ පොලිස් කොමිසමට රාජ්‍ය සේවා කොමිසම, මැතිවරණ කොමිසම් සහා  නැවත ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යය

හයවන පරිච්ඡේදය

## නිගමනය

ලංකාවේ නඩු ප්‍රමාදයක් පවතින අතර මේ හේතුවෙන් වින්දිතයන්ගේ අයිතීන් කඩ වීම සිදු වන අතර වින්දිතයන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාවලිය කාරයක්‍ෂම විය යුතුය.

විකල්ප යෝජනා

- නඩු ඇසීමේ ශාලා හා විනිසුරුවන් ප්‍රමාණාත්මකව වැඩි කිරීම.
- අධිකරණයේ කටයුතු රජ්‍ය භාෂාවලින් සිදුකිරීම
- සමස්ත අධිකරණ ක්‍රියාවලියම පරිගණක ගතකිරීම
- අපරාධ නඩු මුලසිට අගට අසා අවසන් කිරීමේ සම්ප්‍රදායක් ඇති කිරීම
- සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ විශේෂ පනතක් ගෙන ඒම
- පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට අධිකරණ කටයුතු කෙරෙහි පරිචය ලබා දීම
- 2001 සිදු කළ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය මගින් ඇති කළ පොලිස් කොමිසම රාජ්‍ය සේවා කොමිසම, මැතිවරණ කොමිසම් සහා නැවත ක්‍රියාත්මක කිරීම
- අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණ ශාඛා කොළඹින් පිට විවෘත කිරීම.
- සමතකරණය/බේරුම්කරණය හා සමගීකරනය වැනි ගැටුම් නිරාකරණ ක්‍රමවේද ලෙස ජාත්‍යන්තරව පිළිගෙන ඇති ක්‍රමවේදයන් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම.

<u>**පරිශිලනය කළ ග්‍රන්ථ**</u>

1. ලංකාවේ මානව හිමිකම් හා ඒවාට විසදුම් - බැසිල් ප්‍රනාන්දු මහතා
2. www.ahrchk.Net වෙබ් අඩවිය
3. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
4. UNDHR, ICCPR
5. Urgent Appeals, News letters & Statements
6. පත්තර වාර්ථා

<u>**බාධක**</u>

⇒ ප්‍රශ්ණාවලිය පිරවීම සඳහා නිතීඥ වරුන් සොයා ගැනීමට දුෂ්කර වීම.

⇒ සිංහල පරිඝනක කිරීම නොදන්නා නිසා එම කටයුතු ප්‍රමාදවීම.

⇒ වින්දිතයින් සමග සාකච්ජා කිරීමේදි මානසිකව වැටීම.